## ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2014


ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
එම්. ඩී. එච්. ජයවර්ධන මාවත
අතුරුගිරිය

දුරකථනය : 011 - 2770232
ෆැක්ස් : 011 - 2798775
විද්‍යුත් තැපෑල : nipm@sltnet.lk
වෙබ් අඩවිය : www.nipm.gov.lk

# පටුන

## පරිපාලන වාර්තාව


| | පිටුව |
|---|---|
| දැක්ම, මෙහෙවර | 03 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 04 |
| අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය | 05 |
| ආයතනයේ අරමුණු | 06 - 07 |
| පාලක මණ්ඩලයෙහි සංයුතිය | 08 |
| පාලක මණ්ඩලයේ රැස්වීම් | 09 - 10 |
| විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් | 10 - 11 |
| ආයතනයේ කාර්ය මණ්ඩලය | 11 - 12 |
| ආයතනයේ සංවිධාන ව්‍යුහය | 13 |
| පුහුණු අංශය | 14 - 15 |
| වර්ෂය තුළ සිදු කල පුහුණු කිරීමේ කටයුතු | 16 |
| වැව්ලි ක්ෂේත්‍රය සඳහා පුහුණු වැඩ සටහන් | 17 |
| කුඩා වතු හිමියන් සඳහා පාඨමාලා | 18 - 20 |
| පුහුණු ක්‍රමවේදය | 21 |
| වැව්ලි කළමනාකරණ පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව | 22 - 23 |
| පවත්වන ලද බාහිර විභාග | 24 |
| පුස්තකාල පහසුකම් | 24 |
| ආයතනීය වෘත්තීය සාමාජිකත්වය | 25 |
| ප්‍රකාශන | 25 |
| ආයතනය තුළ ඇති පහසුකම් | 26 - 27 |
| 2015 වර්ෂය සඳහා කාර්ය දර්ශනය | 27 - 28 |
| පුහුණු වැඩ සටහන් වල නව පැතිකඩයන් | 28 |
| පරිපාලන අංශය | 29 |
| මූල්‍ය අංශය | 29 - 30 |
| මූල්‍යමය හා භෞතික කාර්ය දර්ශනය | 30 - 34 |
| පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රගතිය | 35 |
| ආයතනය විසින් මුහුණු දුන් ගැටළු | 36 |
| නිගමන | 37 |

## දැක්ම

වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව හා උපදෙස් සැපයීම සහ සමීක්ෂණ පැවැත්වීමේ විශිෂ්ඨ ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

ගුණාත්මක පුහුණුව තුළින් වැවිලි කර්මාන්තයේ සියළුම මානව වත්කම්හි වෘත්තිය නිපුණතාවය පරිපූර්ණත්වය දෙසට ඉහළ නැංවීම.

# සභාපතිතුමාගේ පණිවිඩය

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය වෙනුවෙන් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් සතුටකි.

පසුගිය වසරේ මෙන්ම සළකා බලනු ලබන වර්ෂයේ දී ද තේ, රබර්, පොල් යන ප්‍රධාන වැවිලි බෝගයන්ගෙන් 70% ඉක්මවා සිටින කුඩා වතු හිමියන් වෙනුවෙන් වැඩසටහන් පැවැත්වීමේ වැදගත්කම හඳුනා ගෙන ඇත. ඒ අනුව, වර්ෂය තුළදී වැඩසටහන් 355 ක් මෙම කණ්ඩායම වෙනුවෙන් පවත්වා ඇති අතර, උක් සහ කජු වැනි අනෙකුත් වැවිලි බෝග වගාකරුවන් උදෙසා ද අපගේ සේවය ලබා දෙන ලදී.

2013 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේ දී කැපී පෙනෙන කරුණක් වනුයේ 2014 වර්ෂයේ දී පවත්වන ලද වැඩසටහන් 50% ක වර්ධනයක් පෙන්නුම් කිරීමයි. කුඩා වතු හිමියන් පවත්වනු ලබන වැඩසටහන් යටතේ මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන රු. මිලියන 9.98 ක් වැය කොට පුද්ගලයින් 25,100 ක් පුහුණු කරන ලදී.

අඛණ්ඩව අපගේ සේවාව ලබා ගන්නා පාර්ශවයන්ට මෙන්ම නොයෙකුත් ආකාරයෙන් අපගේ කටයුතු සාර්ථකව ඉටු කර ගෙන යාම සඳහා සහයෝගය ලබා දුන් සියලු දෙනාට මාගේ කෘතඥතාවය පළකර සිටිමි.

එසේම, ඵලදායී ආයතනයක් කරා යාමට අවශ්‍ය සහයෝගය, මඟ පෙන්වීම සහ අනුග්‍රහය ලබා දුන් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටිමි. තව ද අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අනෙකුත් අමාත්‍යාංශ නිලධාරීන්, අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතන සහ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් විසින් ලබා දුන් සහයෝගය සහ මග පෙන්වීම ආයතනයේ කළමනාකරණයට මහත් පහසුවක් වූ අතර ඒ පිළිබඳව ද මාගේ කෘතඥතාව පළකර සිටිමි.

ආයතනයේ සියලුම කාර්යය මණ්ඩලයට, අපගේ අරමුණු ළඟා කර ගැනීම සඳහා ඔවුන් විසින් ලබා දුන් සහයෝගයට ස්තුතිය පුද කරමි. ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ නාමය වැවිලි ක්ෂේත්‍රය තුළ විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලාංකීය ජනතාවගේ හදවතේ සහ මනසේ රඳවා තැබීම මාගේ ඒකායන අරමුණ හා බලාපොරොත්තුව වන්නේය.



**දීප්ති අශෝක අබේවික්‍රම**
**සභාපති**

## අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රයේ මානව උන්නතිය උදෙසා ස්ථාපනය කර ඇති එකම රාජ්‍ය ආයතනය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයයි. ආයතනයේ ආරම්භක 1979 වර්ෂයේ සිට අතුරුගිරිය ප්‍රධාන කාර්යාලය හා බගවන්තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය මේ වන විට ළඟා කර ගෙන ඇති ප්‍රගතිය, සම්පත් හා සේවා පහසුකම් හුදෙක්ම පාර්ලිමේන්තු පනත මඟින් අනුගම්‍ය කොට  ඇති වැවිලි ක්ෂේත්‍රයේ මානව නිපුණතා සංවර්ධන ක්‍රියාවලියන් ඔප් නැංවීම පිණිස වේ.

එමෙන්ම, අධ්‍යාපනික, වෘත්තීය, මානව සම්පත්, කළමනාකරණ සංවර්ධන සේම කාලීන අවශ්‍යතාවයන්ට අනුරූපී නව පුහුණු වැඩසටහන් වැවිලි ක්ෂේත්‍ර අනුබද්ධ ආයතන වෙත පමණක් නොව වෙනත් ඕනෑම ආයතනයකින් හෝ ස්වේච්ඡා සංවිධාන මඟින් ඉල්ලුම් කරනු ලබන වෘත්තීය කුසලතා හෝ දැනුම ඉහළ නැංවීම උදෙසා පැවැත්වීමට අප ආයතනයට බලය පැවරී තිබීම සුවිශේෂී කරුණකි.

2011 වර්ෂය තෙක්, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය රාජ්‍ය අංශය සතු වතු හා ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා පමණක් තම සේවය ලබා දීම සඳහා කැප වී සිටි මුත්, දේශීය දළ නිෂ්පාදනයේ ප්‍රධාන කොටස් කරුවෙකු වන වැවිලි බෝග නිෂ්පාදනය කුඩා වතු හිමියන් අතට පත් වීමත් සමඟ රාජ්‍ය මූල්‍ය අනුග්‍රහය නිබඳව ලබා දීමේ ප්‍රතිඵලයක් ලෙස කුඩා වතු හිමියන් දිරිමත් කරමින් අගය එකතු කළ ගුණාත්මක නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා පසුගිය වසර කිහිපය තුළ කැප වී සිටීමට හැකි වී සිටීම සතුටට කරුණකි.


වර්ෂ 2011 න් පසු වර්ෂයත් සමග සැසඳීමේදී කුඩා වතු හිමියන් වෙනුවෙන් කුසලතා ප්‍රවර්ධන වැඩ සටහන් 355 ක් හා ආදායම් උත්පාදන වැඩ සටහන් 32 ක් 2014 වර්ෂයේ දී පැවැත්වීමට හැකි විය. මීට අමතරව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ විභාග 11 ක් පැවැත්වීමට ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ කුසලතා පූර්ණ සම්පත්දායකයින්ට හැකියාව ලැබිණි. රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත සහනදායී මිල ගණන් යටතේ ශ්‍රවණාගාර හා දේශන ශාලා ආදී යටිතල පහසුකම් ලබා දීම මඟින් රුපියල් මිලියන 14.4 ක ආදායමක් එම වසරේ දී උත්පාදනය කර ගැනීම සඳහා වන ආයතනික ප්‍රගතිය කියාපාන කරුණකි.

කෙසේ වෙතත්, ආයතනික සැලසුම් සහගත ඉලක්ක කරා, විශේෂයෙන් අධ්‍යාපනික හා වෘත්තීය පුහුණු වැඩ සටහන් ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය, 2011 සිට පවතින කාර්යය මණ්ඩල හිඟය යුහුසුළුව සපුරා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් බවට පත්ව ඇත.

එසේම ආයතනයේ ස්ථාපිත කළ යුතු සංවර්ධන හා පර්යේෂණ ඒකකය නුදුරු අනාගතයේ දී ස්ථාපිත කිරීමට සැලසුම් කොට ඇති අතර, ඉහත කරුණු 02 සාක්ෂාත් කර ගැනීම තුළින් වැවිලි ක්ෂේත්‍රයේ අත්‍යාවශ්‍ය අංගයන්ට පහසුකම් සැපයීම නිතැතින් ඉටු කර ගත හැකි වනු ඇත.

ආයතනයේ අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් ඉහත ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ගරු අමාත්‍යතුමාගේ හා ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් ලැබෙන්නා වූ මග පෙන්වීම හා සහයෝගයට ස්තුතිය පුද කර සිටීමට කැමැත්තෙමි.

ඉහත අරමුණු කරා ළඟාවීමේ දී ආයතනයේ පාලක මණ්ඩලයෙන්, අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල කාර්යය මණ්ඩල වලින් හා වැවිලි ක්ෂේත්‍රයේ ඇල්මැති පාර්ශවයන්ගෙන් ලැබුණා වූ දායකත්වය ඉතා අගය කොට සළකන අතර, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ කාර්යය මණ්ඩලයෙන් ලැබුණු නොමසුරු සහය ඉතාමත් ප්‍රශංසනීය බව සඳහන් කරමි.



**ආචාර්ය නිශ්ශංක ඉද්දගොඩ**
**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී**

# ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
# පරිපාලන වාර්තාව

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 ජුලි මාසයේ දී අංක 45 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපනය කරන ලදී. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, රජයට අනුබද්ධිත වඩාත් ඵලදායී හා ශක්තිමත් ව්‍යස්ථාපිත ආයතනයක් කිරීමට මෙම පනත 1981 අංක 76, 1976 අක 05 සහ 2003 අංක 38 දරණ පනත් මඟින් සංශෝධනය කරන ලදී. මෙම පනත් වලට අනුව, පුහුණු වැඩසටහන් / අධ්‍යයන පාඨමාලා සාර්ථකව නිම කරන අයට සහතික පත්‍ර නිකුත් කිරීමට සහ වතු විධායක නිලධාරීන් සඳහා වෘත්තීය සාමාජිකත්වය ප්‍රධාන කාණ්ඩ 03 ක් යටතේ පැවරීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය බල ගන්වා ඇත. කුඩා වතු හිමියන් ද ඇතුළුව වැවිලි ක්ෂේත්‍රයේ රැකියා නියුක්තිකයන්ගේ ඉහළ ප්‍රමිතියෙන් යුත් වෘත්තීය දක්ෂතා පවත්වා ගෙන යාම මේ මඟින් සහතික වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධාකාරයේ සම්මන්ත්‍රණ, වැඩමුළු, විභාග පැවැත්වීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා පර්යේෂණ හා උපදේශන සේවා සැපයීම සිදු කරයි. එමෙන්ම විදේශ සිසුන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමේ හැකියාව ද ඇත.

## 01. පරමාර්ථ

I. ආයතනය තනිවම හෝ ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අනෙකුත් ආයතන සමඟ සහයෝගීව වැවිලි අංශයේ සේවයේ නියුතු සියළුම ශ්‍රේණි වලට අයත් සේවකයින් හට වැවිලි කළමනාකරණයට අදාල පුහුණුව ලබාදීම.



II. වැවිලි අංශයේ සේවයේ නියුතු සේවකයින් හට වැවිලි කළමනාකරණය පිළිබඳව ක්‍රමවත් සංස්කරණ පාඨමාලා සහ සේවාස්ථ පාඨමාලා සම්පාදනය කිරීම.

III. රාජ්‍ය හා පෞද්ගලික වැවිලි කර්මාන්ත අංශයන්හි සේවයේ නියුතු පිරිස් සඳහා වැවිලි කළමනාකරණය පිළිබඳ විශේෂ පුහුණු පාඨමාලා ලබාදීම.

IV. තේ පර්යේෂණ, රබර් පර්යේෂණ, පොල් පර්යේෂණ සහ උක් පර්යේෂණ ආයතනයන්හි සහභාගිත්වය ඇතිව වැවිලි කර්මාන්තය හා සම්බන්ධව ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම.

V. වැවිලි කර්මාන්තය පිළිබඳව සම්මන්ත්‍රණ, වැඩමුළු, සහ සාකච්ඡා වලට අනුග්‍රහය දැක්වීම සහ පැවැත්වීම.

VI. වැවිලි කළමනාකරණය සහ සංවර්ධනයට අදාල ලේඛණ සහ සඟරා පළ කිරීම.

VII. වැව්ලි කළමනාකරණය සහ කම්කරු සම්බන්ධතාවය යන අංශ වලට අදාල පර්යේෂණ සහ සංවර්ධන කටයුතු කිරීම.

VIII. ඵලදායී ලෙස වැව්ලි කර්මාන්තයෙහි නියුක්ත කරවීමට ඇති හැකියාවන් හඳුනා ගනිමින් වැව්ලි කළමනාකරණයෙහි දක්ෂතා ඇති අයට වැව්ලි කළමනාකරණ පුහුණු පාඨමාලා පිරිනැමීම.

IX. ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට හෝ ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටත පිහිටි වෙනත් ආයතනයකට වැව්ලි කර්මාන්තය සම්බන්ධයෙන් කළමනාකරණ තාක්ෂණික සහ පරිපාලනමය උපදෙස් සහ සේවා සැපයීම.

X. ආයතනයේ විවිධ සාමාජිකත්ව ශ්‍රේණි වලට ප්‍රවේශ වීමට අපේක්ෂකයින්ට ඇති යෝග්‍යතාවය තක්සේරු කිරීම සහ සියළුම ශ්‍රේණිවල සාමාජිකත්ව සඳහා යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම, එසේ පැවැත්වීමට ඉඩ සැලසීම සහ එවැනි පරීක්ෂණ සඳහා වූ අධ්‍යාපන පාඨමාලා සංවර්ධනය කිරීම, සැපයීම හෝ අනුමත කිරීම.

XI. තම සාමාජිකයින්ගේ වෘත්තීය කටයුතු වල සහ පොදු චර්යාවෙහි උසස් ප්‍රමිතියක් පවත්වා ගැනීම සහතික කිරීම.

XII. වැව්ලි කළමනාකරණ අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

XIII. වැව්ලි සහ වැව්ලි කළමනාකරණයට අදාල දත්ත රැස් කිරීම, ඒවා බෙදා හැරීම සහ වැව්ලි අංශයේ වර්ධන හැකියාවන් තහවුරු කර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම.

XIV. වැව්ලි කළමනාකරණයට අදාල විධිමත් ප්‍රතිපත්තීන් පිළිබඳව ඇමතිතුමාට උපදෙස් ලබාදීම සහ අනෙකුත් අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

## 1.0 පාලක මණ්ඩලයේ සංයුතිය

1.1 1979 අංක 45 දරණ ජාතික වැව්ලි කළමනාකරණ ආයතන පනතේ 06 වන වගන්තිය සහ 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 දරණ සංශෝධිත පනත්වල විධි විධාන වලට අනුව වර්ෂයේ පාලක මණ්ඩලය පහත දැක්වෙන අයගෙන් සමන්විත විය.

| | *නම* | *සාමාජික ස්වරූපය* |
|---|---|---|
| 1) | රංජිත් සමරසිංහ මහතා<br>සභාපති<br>ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | සභාපති (2014 අගෝස්තු දක්වා) |
| 2) | එස්. පී. හිදැල්ලආරච්චි මහතා<br>සභාපති<br>ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | සභාපති (2014 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා) |

| | | |
|---|---|---|
| 3) | අචාර්ය ඩබ්. එම්. ජී. සෙනෙවිරත්න මහතා<br>අධ්‍යක්ෂ<br>රබර් පර්යේෂණ ආයතනය | සාමාජික (නිල බලයෙන්) |
| 4) | ආචාර්ය අයි. එස්. බී. අබේසිංහ මහතා<br>අධ්‍යක්ෂ<br>තේ පර්යේෂණායතනය | සාමාජික (නිල බලයෙන්) |
| 5) | ආචාර්ය ජයන්ත ගුණතිලක මහතා<br>අධ්‍යක්ෂ<br>පොල් පර්යේෂණායතනය | සාමාජික (නිල බලයෙන්) |
| 6) | ආචාර්ය සී. වී. සිවරත්නම් මහතා<br>නියෝජිත<br>ලංකා වැවිලි කරුවන්ගේ සංගමය | සාමාජික (පත් කළ) |
| 7) | ඊ. ඒ. රත්නා විදිරිසිංහ මහත්මිය<br>අධ්‍යක්ෂ (සැලසුම්)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජිකා (පත් කළ) |
| 8) | අර්ජුන් දැරණියගල මහතා<br>නියෝජිත<br>පොල් වැවිලි කරුවන්ගේ සංගමය | සාමාජික (පත් කළ) |
| 9) | ජේ. ඒ. පී. නිරෝෂිණි මිය<br>සහකාර ලේකම්<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජිකා (පත් කළ) |
| 10) | රංජන් වල්පොල මහතා<br>නියෝජිත<br>පෞද්ගලික තේ කම්හල් හිමියන්ගේ සංගමය | සාමාජික (පත් කළ) |
| 11) | දමයන්ති විජේසිංහ මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | සාමාජිකා (පත් කළ) |
| 12) | කේ. පී. බී. ඔබේසේකර මහතා<br>සාමාන්‍යාධිකාරී<br>කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | සාමාජික (පත්කළ) |
| 13) | මලීන් ගුණතිලක මහතා<br>ලේකම්<br>ලංකා වැවිලි කරුවන්ගේ සංගමය | නිරීක්ෂණ සාමාජික |
| 14) | සරත් සිරිසේන මහතා<br>අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී<br>ලංකා තැරැව් කරුවන්ගේ සංගමය | නිරීක්ෂණ සාමාජික |

| | | |
|---|---|---|
| 15) | එම්. බී. සිරිල් මහතා<br>වැඩ බලන සාමාන්‍යධිකාරී<br>කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | සාමාජික (පත් කළ) |
| 16) | ආර්. එම්. ගුණසේකර මහතා<br>නියෝජිත<br>ශ්‍රී ලංකා කුඩා තේ වතු හිමියන්ගේ සංගමය | සාමාජික |
| 17) | ඩී. එල්. එස්. ඒ. ජයසිංහ මහතා<br>සභාපති<br>තුරුසවිය අරමුදල | සාමාජික |
| 18) | රාජා ප්‍රේමදාස මහතා<br>අධ්‍යක්ෂ<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | සාමාජික (නිල බලයෙන්)<br>(2014 ජූලි සිට දෙසැම්බර් දක්වා) |
| 19) | ජී. ඩී. ඩබ්. ජයවර්ධන මහතා<br>වැඩ බලන අධ්‍යක්ෂ<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | සාමාජික (පත්කළ)<br>(2014 ජනවාරි සිට ජුනි දක්වා) |

## 1.2 පාලක මණ්ඩලයේ රැස්වීම

සමාලෝචිත වර්ෂයේ දී පාලක මණ්ඩලයේ රැස්වීම් වාර 10 ක් අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ දී පවත්වන ලදී. මෙම රැස්වීම් වලදී පහත සඳහන් කරුණු සමාලෝචනය කිරීම / පැහැදිලි කිරීම් අනුමත කිරීම සිදු කරන ලදී.

I. අයවැය ඇස්තමේන්තු සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම.

II. ලැබිය යුතු පාඨමාලා ගාස්තු, ඒවා අයකර ගත හැකි මාර්ග සහ අය කර ගත නොහැකි පාඨමාලා ගාස්තු සාධාරණ හේතු මත කපා හැරීම.

III. ආයතනයේ පුහුණු කිරීමේ කටයුතු, ගිණුම සහ පරිපාලන අංශයන්ට අදාළ අනෙකුත් කටයුතු.

IV. ආයතනයේ කාර්යය මණ්ඩලය සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන දේශීය සහ විදේශීය ශිෂ්‍යත්ව සහ වැඩමුළු සඳහා අනුමැතිය ලබා දීම

V. විවිධ අංශයන්හි කාර්යභාරය පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කිරීම.

VI. විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලද කරුණු අනුමත කිරීම.

VII. ආයතනය විසින් පිළියෙල කරන ලද පසුගිය වර්ෂයට අදාළ විගණන ගැටළු සඳහා පිළිතුරු සමාලෝචනය කිරීම.

VIII. නව තනතුරු සඳහා බඳවා ගැනීම් සහ උසස්වීම් අනුමත කිරීම.

IX. යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්ම කිරීම.

X. ඊළඟ වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තුව.

XI. පසුගිය වර්ෂයට අදාළ පරිපාලන වාර්තා සහ අවසාන ගිණුම්.

XII. ආයතනයේ වැඩ කටයුතු වල ගුණාත්මක බව වැඩි කිරීම සඳහා උපාය මාර්ග සම්පාදනය කිරීම.

XIII. ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු.

XIV. අධ්‍යාපනික සහ වෘත්තීය වැඩ සටහන් වල ප්‍රගතිය.

XV. විභාග පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම.

XVI. ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් පත් කිරීම.

## 2.0 විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්

ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුව මුදල් අමාත්‍යාංශ උපදේශයන්ට අනුකූලව පිහිටුවා ඇති අතර, පහත සඳහන් කරුණු පාලනය සඳහා එයට නිසි බල අධිකාරිය ආයතනයේ පාලක මණ්ඩලය මගින් ලබා දී ඇත.

- මූල්‍ය වාර්තාකරණය
- අභ්‍යන්තර පාලනය.
- විගණන ගැටළු සහ පිළිතුරු වලට සම්බන්ධ කරුණු.
- ප්‍රසම්පාදන කමිටු තීරණ සහ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වල භාවිතය.
- අයවැය ඇස්තමේන්තු සහ සත්‍ය කාර්ය සාධනයේ ප්‍රගතිය
- අතිකාල දීමනා, ඉන්ධන භාවිතය, දුරකථන ගාස්තු සහ විදුලිය වියදම් යනාදිය පිළිබඳව දරන ලද වියදම් අයවැය ඇස්තමේන්තුව සමඟ සන්සන්දනය කිරීම.
- පුහුණු කිරීමේ වැඩසටහන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලට අදාළ ආදායම හා වියදම්.
- ආයතනයට අදාල අනෙකුත් මූල්‍ය ක්‍රියාකාරකම්

**සාමාජිකත්වය**

විගණන හා කළමනාකරණ කමිටුව පහත සඳහන් ක්‍රියාකාරී නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. එහි ලේකම් ලෙස ආයතනයේ ගණකාධිකාරී ප්‍රවර්තන වර්ෂයේදී කටයුතු කර ඇත. මෙම වර්ෂයේ රැස්වීම් හතරක් (4) පවත්වා ඇති අතර, ඉහත සඳහන් කරුණු සාකච්ඡාවට බඳුන් වූ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**සාමාජිකයින් පහත පරිදි වේ.**

දමයන්ති විජේසිංහ මහත්මිය - සභාපතිනිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

| | | |
|---|---|---|
| ආචාර්ය ජයන්ත ගුණතිලක මහතා<br>අධ්‍යක්ෂ<br>පොල් පර්යේෂණායතනය | - | සාමාජික |
| රත්නා විදිරිසිංහ මහත්මිය<br>අධ්‍යක්ෂ - සැලසුම්<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | - | සාමාජික සැප්තැම්බර් සිට |
| ඩබ්. ඒ. ඩී. ඩී. එම්. ප්‍රියන්ත මහතා<br>අභ්‍යන්තර විගණක<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | - | නිරීක්ෂණ සාමාජික |
| ලලනී ගුණතිලක මහත්මිය<br>විගණන පාලක<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව | - | නිරක්ෂණ සාමාජික |
| එල්. ඩී. ජේ. ප්‍රියන්ත මහතා<br>ගණකාධිකරී<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | - | ලේකම්<br>විගණන හා කළමනාකරණ කමිටුව |

## 3.0 ආයතනීය කාර්යය මණ්ඩලය - 2014

2014 වර්ෂය අවසාන වන විට ස්ථිර කාර්ය මණ්ඩලය 46 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සාර්ථකත්වය උදෙසා කාර්යය මණ්ඩලයේ මනා කැපවීම සහ නොමසුරු දායකත්වය පිටුවහලක් විය.

### 3.1.1 තනතුර ප්‍රමාණය

| | |
|---|---|
| සභාපති | 01 |
| අධ්‍යක්ෂ | 01 |

### 3.1.2 පුහුණු කිරීමේ අංශයේ කාර්යය මණ්ඩලය

| | |
|---|---|
| පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ) | 01 |
| පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ) | 01 |
| පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික) | 01 |
| පුහුණු කිරීමේ නිලධාරී (කළමනාකරණ) | 01 |
| පුහුණු කිරීමේ නිලධාරී (කෘෂි ආර්ථික) | 01 |
| මාණ්ඩලික සහකාර (පුහුණු) | 01 |
| පුස්තකාලයාධිපති | 01 |

| | |
|---|---|
| කළමනාකරණ සහකාර (I ශ්‍රේණිය) | 01 |
| කළමනාකරණ සහකාර (II ශ්‍රේණිය) | 02 |
| කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය) | 02 |
| කාර්යාල කාර්යය සහායක | 02 |

### 3.1.3 පරිපාලන අංශයේ කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | 01 |
| පරිපාලන නිලධාරී | 01 |
| නේවාසික කළමනාකරු | 01 |
| කළමනාකරණ සහකාර (I ශ්‍රේණිය) | 01 |
| කළමනාකරණ සහකාර (II ශ්‍රේණිය) | 02 |
| කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය) | 03 |
| රියදුරු | 06 |
| උද්‍යාන සහායක | 04 |
| කාර්යාල කාර්යය සහායක | 03 |
| නේවාසිකාගාර සහායක | 03 |

### 3.1.4 ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලය


| | |
|---|---|
| ගණකාධිකාරී | 01 |
| කළමනාකරණ සහකාර (1 ශ්‍රේණිය) | 02 |
| කළමනාකරණ සහකාර (11 ශ්‍රේණිය) | 02 |
| කළමනාකරණ සහකාර (111 ශ්‍රේණිය) | 02 |
| කාර්යාල කාර්යය සහායක | 01 |

### 3.2 ආයතනීය ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

| | | |
|---|---|---|
| රංජිත් කුමාර සමරසිංහ මහතා | - | සභාපති (2014 අගෝස්තු දක්වා) |
| එස්. පී හිඳැල්ලආරච්චි මහතා | - | සභාපති (2014 සැප්තැම්බර් මස සිට නොවැම්බර් මස දක්වා) |
| ජී. ඩී. ඩබ්. ජයවර්ධන මහතා | - | වැඩ බලන අධ්‍යක්ෂ (2014 ජුනි දක්වා) |
| රාජා ප්‍රේමදාස මහතා | - | අධ්‍යක්ෂ (ජුනි මස සිට දෙසැම්බර් මස දක්වා) |
| පී. එච්. ජයතිලක මහතා | - | පුහුණුකිරීමේ විශේෂඥ (ගිණුම් හා මුල්‍ය කළමනාකරණ) |
| එල්. ඩී. ජේ ප්‍රියන්ත මහතා | - | ගණකාධිකාරී |
| එස්. එන්. ඉලංගන්තිලක මිය | - | පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික) |
| ආර්. එන් ලොකුහෙට්ටි මිය | - | පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ) |

සංවිධාන ව්‍යුහය පිටු අංක 13 හි සඳහන් වේ.

# ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය
## සංවිධාන ව්‍යුහය



## 4.0 පුහුණු කිරීමේ අංශය

1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ පනත හා ඊට පසුව ඇති කරන ලද සංශෝධන පනත් වලට අනුකූලව ආයතනයේ මූලික අරමුණ වන්නේ කුඩා වතු හිමියන් ඇතුළු වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ වූ අය සඳහා ඉගෙනීමේ හා පුහුණු වීමේ අවස්ථා ලබා දීමයි. වැවිලි අංශය යනුවෙන් අර්ථ දැක්වෙන්නේ තේ, රබර්, පොල්, උක්, කජු, තල්, කිතුල් සහ කුරුඳු ආදී බහු වාර්ෂික බෝගයන් වේ. මෙම අරමුණු දිනා ගැනීම සඳහා සිදු කෙරෙන ආයතනයේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් කොටස් 07 කට බෙදා දැක්විය හැක.

සහභාගි වන්නන්ගේ අධ්‍යාපන සුදුසුකම් ඉහළ නැංවීම සහ නිපුණතා සංවර්ධනය කිරීම උදෙසා අධ්‍යාපන පාඨමාලා නිර්මාණය කොට ඇත. මෙම පාඨමාලාවල සහතික පත්‍ර ලබා දීම සඳහා සහභාගිවන්නන් තම අධ්‍යාපන වාර්තා නිසි පරිදි පවත්වා ගෙන යා යුතු අතර ඊට අවශ්‍ය සියළු අවශ්‍යතා සම්පූර්ණ කල යුතුය. ආයතනය මගින් පවත්වනු ලබන අධ්‍යාපන පාඨමාලා පහත පරිදි වේ.

- වයඹ විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධව පවත්වනු ලබන වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධි පාඨමාලාව
- වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව
- වැවිලි ව්‍යාප්තිකරණ කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව
- වැවිලි ගිණුම්කරණය සහ මුල්‍ය කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- පොත් තැබීම හා වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ව්‍යාපාර ඉංග්‍රීසි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- දෙමළ භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා කළමනාකරණය පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගය
- ආධුනිකයින් සඳහා වතු පාලනය පිළිබඳ පෙරහුරු පාඨමාලාව
- ආධුනිකයින් සඳහා වතු පාලනය පිළිබඳ උසස් පුහුණු පාඨමාලාව

### ආ) වෘත්තීය පාඨමාලා පැවැත්වීම

වෘත්තිය පාඨමාලාවල මූලික අරමුණ වන්නේ න්‍යායාත්මක / ප්‍රායෝගික දැනුම සහ කුසලතාවන් සහභාගිවන්නන් වෙත සම්ප්‍රේෂණය කිරීමයි. මෙම පාඨමාලා නිර්මාණය කොට ඇත්තේ ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය සහ ආයතනය වෙත ඔවුන්ගෙන් ලැබෙන වටිනාකම වැඩි කිරීම පිණිසයි. ආයතනය විසින් පවත්වනු ලබන වෘත්තිය පාඨමාලා පහත පරිදි වේ.

- තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- රබර් නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය

- පොල් නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- භාෂා ප්‍රවීනතා විභාගය
- තේ වගාව පිළිබඳ වෘත්තීය පාඨමාලාව
- රබර් වගාව පිළිබඳ වෘත්තීය පාඨමාලාව



**ඇ) <u>නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම</u>**

මෙම පාඨමාලා විශේෂයෙන්ම නිර්මාණය කොට ඇත්තේ යම් රැකියාවක් සඳහා අවශ්‍ය කුසලතා සහ හැකියාවන් වර්ධනය කිරිම සඳහායි. රැකියාවේ කාර්යන් සඳහා අවශ්‍ය නව තාක්ෂණය සහ ක්‍රම වේද හඳුන්වා දීම ද මෙම වැඩ සටහන්වල අරමුණක් වේ.



- විවිධ වැඩමුළු, සම්මන්ත්‍රණ හා සංසඳ
- කුසලතා වර්ධන පුහුණු වැඩසටහන්
- කම්කරු සංවර්ධන වැඩසටහන්
- කළමනාකරණ සංවර්ධන වැඩසටහන්
- කුඩා වතුහිමියන් සදහා පුහුණු වැඩසටහන්

**ඈ)** වැවිලි කළමනාකරණය පිළිබඳ ප්‍රකාශන නිකුත් කිරීම. (වැවිලි කළමනාකරණය පිළිබඳ සඟරාව, පුවත් ලිපිය, විවිධ වැඩසටහන්වලට අදාල පුහුණු අත්පොත් සහ වෙනත් කාලීන ප්‍රකාශන)

**ඉ)** වැවිලි කළමනාකරණය පිළිබඳ සමීක්ෂණ හා උපදේශන සේවා සැපයීම සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා විභාග (ලිඛිත හා වාචික) පැවැත්වීම.

**ඊ)** සුදුසුකම්ලත් වැවිලි විධායකයින් සඳහා ආයතනික වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීම. (ගෞරව සාමාජිකත්වය, පූර්ණ සාමාජිකත්වය, ආශ්‍රිත සාමාජිකත්වය සහ ශිෂ්‍ය සාමාජිකත්වය)

**උ)** රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා පුහුණු පහසුකම් සැපයීම. (ආහාර පාන,නවාතැන්, දේශන ශාලා සහ ප්‍රවාහන පහසුකම් ආදිය)

## 4.1 වර්ෂය තුළ සිදු කල පුහුණු කිරීමේ කටයුතු

ආයතනය මූලික වශයෙන් දෙයාකාරයකින් වැඩසටහන් පවත්වන ලද අතර ඒවා නම් වැවිලි සමාගම් සඳහා ආදයම් උපදවන වැඩසටහන් සහ කුඩා වතු අංශය සඳහා භාණ්ඩාගාරික ප්‍රතිපාදන භාවිතයෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන් වශයෙනි. මෙම වැඩසටහන් 2014 කාර්ය දර්ශනයට ඇතුලත් කර ඇති අතර එම විස්තර පහත දැක්වේ.



*කුඩා වතු හිමියන් සඳහා වැඩසටහන්*



*නායකත්ව පුහුණු වැඩසටහන්*

### ආදයම් උපදවන වැඩසටහන්

| | වැඩසටහන් වර්ගය | වැඩසටහන් ප්‍රමාණය | එක් එක් වැඩසටහන් සඳහා කාලය | පුහුණු වුවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධි පාඨමාලාව | කණ්ඩායම් 01 | වසර 03 | 92 |
| 02 | වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | කණ්ඩායම් 01 | මාස 18 | 17 |
| 03 | තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය පිළිබඳ වෘත්තීය පාඨමාලාව | කණ්ඩායම් 01 | දින 09 | 34 |
| 04 | රබර් නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය පිළිබඳ වෘත්තීය පාඨමාලාව | කණ්ඩායම් 01 | දින 07 | 11 |
| 05 | වැවිලි ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | කණ්ඩායම් 01 | මාස 12 | 17 |
| 06 | පොත් තැබීම සහ වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | කණ්ඩායම් 01 | මාස 12 | 19 |
| 07 | ව්‍යාපාර ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | කණ්ඩායම් 01 | මාස 12 | 11 |
| 08 | රබර් ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා කුසලතා වර්ධන පුහුණු පාඨමාලාව | කණ්ඩායම් 01 | දින 05 | 40 |
| 09 | තේ කර්මාන්ත ශාලා නිලධාරීන්ගේ කුසලතා වර්ධන පුහුණු වැඩ සටහන | කණ්ඩායම් 01 | දින 05 | 18 |
| 10 | ආධුනිකයින් සඳහා වතු පාලක පෙරහුරු පාඨමාලාව | කණ්ඩායම් 01 | මාස 06 | 29 |
| 11 | කළමනාකරණ සංවර්ධන පුහුණු වැඩසටහන් | කණ්ඩායම් 14 | දින 01/ දින 02 | 408 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | කුරුඳු වගා කිරීම පිළිබඳ මූලික පාඨමාලාව | කණ්ඩායම් 01 | දින 02 | 49 |
| 13 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ රබර් සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලාව | කණ්ඩායම් 03 | දින 05 | 95 |
| 14 | විශේෂ පුහුණු වැඩසටහන් | කණ්ඩායම් 04 | දින 01 | 153 |
| | **මුළු ගණන** | **32** | - | **993** |

## 4.2 වැවිලි ක්ෂේත්‍රය සඳහා පුහුණු වැඩසටහන් (ආදායම් උපයන)

2014 වර්ෂයේදී අපේක්ෂා කරනු ලැබූ වැඩසටහන් ප්‍රමාණය සහ පවත්වනු ලැබූ වැඩසටහන් ප්‍රමාණය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් පහත දැක්වේ. 2014 කාර්ය දර්ශනයට අනුව ආයතනය මගින් පුහුණු වැඩසටහන් 49 ක් මගින් පුහුණුවන්නන් 1,030 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් සකස් කර තිබුණි. මේ සඳහා රු. මිලියන 17.072 ක ආදායමක් පුහුණු කිරීමේ කටයුතු තුළින් උපයා ගැනීමට අදහස් කරන ලදී. කෙසේ වෙතත් ආයතනය මගින් පුහුණු කිරීමේ වැඩසටහන් 32 ක් පවත්වා පුද්ගලයින් 993 දෙනෙකු පුහුණු කල අතර රු.මිලියන 10.036 ක මුදලක් උපයා ගන්නා ලදී. ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාවෙන් 65% ක් සහ පුහුණුවන්නන් සංඛ්‍යාවෙන් 96% ක් ලෙස මේ වසර තුළ සත්‍ය කාර්ය සාධනයක් පෙන්වා ඇත. අපේක්ෂිත ප්‍රමාණයෙන් 59% ක ආදායමක් උපයා ගන්නා ලදී.

2 වන වගුව

**ආදායම් උපයන පුහුණු වැඩසටහන් - 2014 - ඇස්තමේන්තුගත ප්‍රමාණය සහ සත්‍ය ප්‍රමාණය**

| වැඩසටහනේ නම | ඇස්තමේන්තුගත | | | සත්‍ය | | | ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ සටහන් ප්‍රමාණය | සිසුන් ගණන | ආදායම රු. මිලියන | වැඩ සටහන් ප්‍රමාණය | සිසුන් ගණන | ආදායම රු. මිලියන | වැඩ සටහන් ප්‍රමාණය | සිසුන් ගණන | ආදායම රු. මිලියන |
| අධ්‍යාපනික සහ වෘත්තීය පාඨමාලා | 16 | 327 | 11.830 | 08 | 230 | 6.660 | 50% | 70% | 56% |
| කුසලතා වර්ධන වැඩසටහන් | 06 | 90 | 1.388 | 02 | 58 | 0.718 | 33% | 64% | 51% |
| විශේෂ පුහුණු වැඩසටහන් | 13 | 400 | 1.500 | 07 | 248 | 0.866 | 53% | 62% | 57% |
| කළමනාකරණ සංවර්ධන වැඩසටහන් | 12 | 178 | 0.979 | 14 | 408 | 1.332 | 116% | 229% | 136% |
| කම්කරු සංවර්ධන වැඩසටහන් | 02 | 35 | 0.175 | 01 | 49 | 0.050 | 50% | 140% | 28% |
| බාහිර විභාග | | | 1.200 | | | 0.410 | | | 34% |
| **මුළු ගණන** | **49** | **1030** | **17.072** | **32** | **993** | **10.036** | **65%** | **96%** | **59%** |





3 වන වගුව

**ආදායම උපදවන වැඩ සටහන් සඳහා ලාභ අලාභ විශ්ලේෂණය**

| වැඩ සටහනේ නම | ආදායම (රු. මිලියන) | වියදම (රු. මිලියන) | ලාභ/අලාභ |
|---|---|---|---|
| 1. අධ්‍යාපනික පුහුණු වැඩ සටහන් | 6.660 | 2.820 | 3.840 |
| 2. කුසලතා වර්ධන පුහුණු වැඩ සටහන් | 0.718 | 0.350 | 0.368 |
| 3. කළමනාකරණ සංවර්ධන පුහුණු වැඩ සටහන් | 1.332 | 0.670 | 0.662 |
| 4. කම්කරු සංවර්ධන වැඩ සටහන් | 0.050 | 0.042 | 0.008 |
| 5. විශේෂ පුහුණු වැඩ සටහන් | 0.866 | 0.409 | 0.457 |
| 6. බාහිර විභාග | 0.410 | 0.111 | 0.299 |
| **මුළු ගණන** | **10.036** | **4.402** | **5.634** |

## 4.3 කුඩා වතු හිමියන් සඳහා පාඨමාලා (භාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතයෙන්)

වැවිලි කර්මාන්ත අමාත්‍ය, ගරු මහින්ද සමරසිංහ මැතිතුමාගේ උපදෙස් පරිදි කුඩා වතු හිමියන්ගේ දැනුම සහ කුසලතාවය සවිබල ගැන්වීම පිණිස 2011 වර්ෂයේ දී ආයතනය විසින් කුඩා වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතා කරන අතර සහභාගී වන්නන්ගෙන් කිසිදු මුදලක් අය නොකෙරේ.

වැවිලි බෝග නිෂ්පාදනය කෙරෙහි කුඩා වතු හිමියන්ගේ කාර්ය භාරයේ වැදගත්කම හඳුනා ගත් භාණ්ඩාගාරය 2014 වසරේ දී කුඩා වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට රු. මිලියන 10 ක් ප්‍රදානය කළ අතර, ඉන් තේ, රබර්, පොල්, කජු, උක් සහ කුරුඳු කුඩා වතු හිමියන් 25,100 දෙනෙකු සඳහා වැඩ සටහන් 355 ක් පවත්වන ලදි.

කුඩා වැවිලි ක්ෂේත්‍රය සඳහා පැවැත්වූ පාඨමාලාවන් ධාරිතා වර්ධන පාඨමාලා යටතේ පවත්වන ලද අතර, එකී වියදම් ප්‍රාග්ධන වියදම් ගණයට ගණන් ගැනේ. අදාල කාලය තුළදී කුඩා වැවිලි ක්ෂේත්‍රය සඳහා පැවැත්වූ පාඨමාලාවන් සංඛ්‍යාව සහ පුහුණුව ලැබූ කුඩා වතු හිමියන් සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.



4 වන වගුව

## කුඩා වතු හිමියන් සඳහා ධාරිතා වර්ධන පාඨමාලා - 2014

| වැඩසටහන් වර්ගය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූවන් ගණන |
|---|---|---|
| කුඩා රබර් වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 172 | 14105 |
| කුඩා තේ වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 102 | 6329 |
| කුඩා පොල් වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 54 | 3270 |
| කුඩා කජු වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 10 | 508 |
| කුඩා උක් වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 11 | 547 |
| කුඩා කුරුඳු වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 06 | 341 |
| **පවත්වන ලද වැඩ සටහන් ගණන** | **355** | **25100** |
| **සැලසුම් කල වැඩ සටහන් ගණන** | **200** | **8000** |

5 වන වගුව

## කුඩා වතු හිමියන් සඳහා ධාරිතා වර්ධන පාඨමාලා - 2014

| වැඩසටහන් වර්ගය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූවන් ගණන | පිරිවැය (රු. මිලියන) |
|---|---|---|---|
| කුඩා රබර් වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 172 | 14105 | 5.203 |
| කුඩා තේ වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 102 | 6329 | 2.351 |
| කුඩා පොල් වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 54 | 3270 | 1.755 |
| කුඩා කජු වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 10 | 508 | 0.188 |
| කුඩා උක් වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 11 | 547 | 0.276 |
| කුඩා කුරුඳු වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 06 | 341 | 0.208 |
| **පවත්වන ලද වැඩ සටහන් ගණන** | **355** | **25100** | **9.981** |
| **සැලසුම් කල වැඩ සටහන් ගණන** | **200** | **8000** | **10.00** |

මෙම සියලු පාඨමාලාවන් ඒ ඒ ප්‍රදේශ වල තේ, රබර්, පොල්, කජු සහ උක් යන ක්ෂේත්‍ර වලදී පවත්වන ලදී. එහිදී න්‍යායාත්මක දේශන වලට වඩා වැඩි කාලයක් ප්‍රායෝගික පුහුණු සැසි හා ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලදී. මෙවැනි පාඨමාලාවක් සඳහා කාලය පැය 05 කට සීමා කරන ලදී.

ඉහත කරන ලද විස්තරයන් පෙර වර්ෂ හා සංසන්දනාත්මක ලෙස පහතින් සඳහන් කර ඇත.





6 වන වගුව

## සාරාංශ ගත තොරතුරු

| | 2013 | 2014 | ප්‍රගතිය % |
|---|---|---|---|
| වැඩසටහන් ගණන (එකතුව) | 258 | 387 | 50 |
| සහභාගී වූවන් ගණන (එකතුව) | 11,422 | 26,093 | 128 |
| කුඩා වතු හිමියන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් ගණන | 236 | 355 | 50 |
| පුහුණු වූ කුඩා වතු හිමියන් ගණන | 12,149 | 25,100 | 106 |
| ඉපයූ ආදායම | රු. මිලියන 11.573 | රු. මිලියන 10.037 | -0.13 |
| කුඩා වතු හිමියන් පුහුණු කිරීම සඳහා දරන ලද වියදම | රු. මිලියන 7.49 | රු. මිලියන 9.98 | 33 |

කුඩා වතු හිමියන් සඳහා පැවැත් වූ වැඩ සටහන් සංඛ්‍යාවේ ඉහළ යාම නිසා 2014 වර්ෂයේ දී මුළු වැඩ සටහන් සංඛ්‍යාව ඉහළ ගිය අතර ආදායම් උපයන වැඩ සටහන් සංඛ්‍යාව අපේක්ෂා කළ පරිදි ඉහළ යාමක් සිදු වී නැත. එබැවින් 2014 වසරේ දී පුහුණු වැඩ සටහන් වලින් ලැබුණු ආදායමේ වැඩි වීමක් දක්නට නොලැබුණි.

## 4.4 පුහුණු ක්‍රමවේදය

අධ්‍යාපනික පාඨමාලා සහ පුහුණු සැසි පැවැත්වෙන ක්‍රමවේදය අදාල පාඨමාලාවන් හා සම්බන්ධ විචල්‍යයන් පිළිබද සැලකිල්ලට ලක් කරමින් ප්‍රමිතකරණය කොට ඇත. එක් එක් පාඨමාලාවට අදාල කාලය හා කාල රාමුව තීරණය කිරීමේදී පාඨමාලාවන්ට සහභාගී වන අයගේ මට්ටම්, ඔවුන්ගේ තනතුරු, රාජකාරී ස්ථාන සහ රාජකාරී නිවාඩු යනාදිය පිළිබඳ සැලකිල්ලට ගනු ලැබේ. වතු විධායකයින් සඳහා පැවැත්වෙන දිගු කාලීන පාඨමාලා කොටස් කිහිපයකට බෙදා මොඩියුල ක්‍රමයට කඩින් කඩ පවත්වනු ලැබේ. දේශන සහ ප්‍රායෝගික සැසි පැවැත්වෙන දින තීරණය කිරීමේදී සහභාගීවන්නන් වතු වල රැඳී සිටිය යුතු දින ඉවත් කර ඇත. සාමාන්‍යයෙන් දිගු කාලීන පාඨමාලා වලදී එක් මසකට දින 06 ක් දේශන පැවැත්වුවද, ඒවා නොකඩවා පැවැත්වෙන්නේ නැත. පාඨමාලා සඳහා සහභාගී වන වතු විධායකයින්ගේ දෛනික වැඩ කටයුතු අඩාල නොවන පරිදි බොහෝ විට පළමුවන සතියේ සිකුරාදා සහ සති අන්තයේද, තුන්වන සතියේ සිකුරාදා සහ සති අන්තයේද දේශන පැවැත්වේ. එහෙත් කුසලතා වර්ධන හා වෘත්තීය පරීක්ෂණ වලට අදාල වැඩසටහන් නොකඩවා දින 05 සිට 07 දක්වා පැවැත්වෙන අතර, කළමනාකරණ සංවර්ධන වැඩසටහන් එක් දින හෝ දෙදින වැඩ මුළු වශයෙන් පැවැත්වේ. නමුත් වතු කම්කරුවන් හා කුඩා වතු හිමියන් සඳහා වැඩමුළු බොහෝ විට එක් දිනකට (පැය 05 ක් හෝ 06 කට පමණ) සීමාකර ඇති අතර, මෙම වැඩමුළු අදාල ප්‍රදේශයන් තුළ පවත්වනු ලැබේ.

පාඨමාලා පැවැත්වීමේදී ආයතනය විසින් සාමූහික සාකච්ඡා, සාමූහික අභ්‍යාස, ආදර්ශන, සිද්ධි අධ්‍යයන, ක්ෂේත්‍ර චාරිකා, අත්දැකීම් හුවමාරු ක්‍රමවේදය සහ භූමිකා රංගන ආදී නවීන පුහුණු ක්‍රමවේදයන් භාවිතයට ගනී.

ක්ෂේත්‍ර සහ කර්මාන්තශාලා සේවකයින් සඳහා වැඩි වශයෙන් ප්‍රායෝගික සැසි භාවිතා වන අතර, අධ්‍යාපනික පාඨමාලා වලදී දේශන සඳහා වැඩි අවධානයක් යොමු කරනු ලබයි. කම්කරුවන් හා කුඩා වතු හිමියන් සඳහා පැවැත්වෙන වැඩමුළු වලින් 80% ක් පමණ වැය කෙරෙන්නේ ප්‍රායෝගික සැසි සඳහාය. මෙවැනි ක්‍රමවේදයන් තුළින් කියවීමට, ශ්‍රවණය කිරීමට, ලිවීමට සහ අවධානය යොමු කිරීම සඳහා ඔවුන්ගේ පසුබෑම මඟ හරවමින් ඔවුන් වැඩමුළුව සඳහා වඩාත් ඵලදායී ලෙස සහභාගී කර ගැනීම සිදුවේ.

විධායක ශ්‍රේණිය වෙනුවෙන් පවත්වනු ලබන කළමනාකරණ සංවර්ධන වැඩසටහන් වලදී භූමිකා රංගන, සිද්ධි අධ්‍යයන, කළමනාකරණ ක්‍රීඩා සහ බුද්ධි කලම්බන සැසි වලට විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

පසුගිය වර්ෂයන්හි ලත් අත්දැකීම් අනුව බලන විට ආයතනයට සෑම විෂයක් සදහාම පුහුණු කිරීමේ නිලධාරීන් ප්‍රමාණවත් තරම් බඳවා ගැනීම අපහසු වීමත් සහ පිරිවැය අධික වීමත් හේතුවෙන් එයට සුදුසු විකල්පයක් ලෙස බාහිර සම්පත් දායකයින් යොදා ගැනිම සිදු විය. සමාලෝචිත වර්ෂය සඳහා එනම් ඔක්තෝම්බර් මාසය වන විට ආයතනය සතු වූයේ ස්ථිර පුහුණු කිරීමේ සම්පත්දායකයින් 05 දෙනෙක් පමණක් වූ අතර, ඉන් එක් අයෙක් තනතුරෙන් ඉල්ලා අස්වන ලදි. එබැවින් තේ, රබර්, පොල් සහ උක් ආදී වූ බෝග පර්යේෂණ ආයතන වල විද්‍යාඥයින් හා දේශකවරුන් මෙන්ම විශ්ව විද්‍යාල ආචාර්යය / මහාචාර්යවරුන් හා අත්දැකීම් සම්භාරයක් ඇති පළපුරුදු වතු පාලකයින් ආදීන්ගේ සහාය පාඨමාලා පැවැත්වීමේදී බාහිර සම්පත්දායකයින් ලෙස යොදා ගැනීමට ආයතනය විසින් පෙළඹුනි. කෙසේ වුවද, අධ්‍යාපනික හා අනෙකුත් පුහුණු පාඨමාලා සඳහා සම්පත්දායකයින් තෝරා ගැනීමේදී ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම, ආයතනික පළපුරුද්ද හා ඉගැන්වීමේ / පුහුණු කිරීමේ හැකියාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.



## 4.5 වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව

වැවිලි කළමනාකරණ උපාධි පාඨමාලාව, වැවිලි ක්ෂේත්‍රයේ නියුතු විශේෂයෙන් කුඩා වතු හිමියන්ද ඇතුළුව ජ්‍යෙෂ්ඨ සහ මැද පෙළ කළමනාකරුවන්ගේ කළමනාකරණ සහ තාක්‍ෂණ සංවර්ධනය සඳහා නිර්මාණය කර ඇත.


2006 වර්ෂය වන තුරු වැවිලි ක්ෂේත්‍රය තුළ උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාවක් නොතිබූ අතර, ක්ෂේත්‍රයෙහි නියුතු වූවන්ට තම කළමනාකරණ සහ වෘත්තීමය හැකියාවන් ඩිප්ලෝමා මට්ටමට වඩා ඉහළ මට්ටමකට දියුණු කර ගැනීමේ අවශ්‍යතාවය පැන නැඟුනි. එබැවින් වැවිලි ක්ෂේත්‍රය තුළ ඇති වූ මෙම දැඩි අවශ්‍යතාවය සපුරාලමින් කළමනාකරුවන් වෘත්තීමය වශයෙන් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි මට්ටමට දියුණු කළ යුතු විය.

කර්මාන්තයේ ඵලදායිතාවය, ලාභදායිතාවය සහ එහි තිරසාරභාවයත් පිළිබඳ තහවුරු කර ගැනීම හා මෙම අවශ්‍යතාවයේ හිඩැස පිරවීම පිණිස වැවිලි ක්ෂේත්‍රයේ නිරත ජ්‍යෙෂ්ඨ සහ මැද පෙළ කළමනාකාරීත්වයට සූක්‍ෂම සහ සාර්ව මට්ටමින් විද්‍යාත්මක, න්‍යායාත්මක සහ කළමනාකාරීත්ව ප්‍රවීණත්වය ලබාදිය යුතු විය. මෙම අවශ්‍යතාවය සපුරාලීම උදෙසා සර්ව සම්පූර්ණ, සවිස්තරාත්මක අධ්‍යාපන පාඨමාලාවක් සකස් කල යුතු විය. ඒ සඳහා දරන ලද ප්‍රයත්නයෙහි ප්‍රතිඵලයක් ලෙස 2006 වර්ෂයේදී වයඹ



විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය විද්‍යාවේදී වැව්ලි කළමනාකරණ උපාධි පාඨමාලාව හඳුන්වා දෙන ලදී. මෙය වසර 03 ක දුරස්ථ අධ්‍යාපන පාඨමාලාවක් විය. ආරම්භයේදී වැව්ලි විධායකයින් 21 දෙනෙකු මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ අතර 2008 වර්ෂයේදී 17 දෙනෙකු සාර්ථක ලෙස උපාධිය අවසන් කරන ලදී. සෑම වර්ෂයකම ලියාපදිංචි වූ සිසුන් ගණන සහ උපාධිය සාර්ථක ලෙස අවසන් කල සිසුන් පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| ***වර්ෂය*** | ***ලියාපදිංචි වූ සංඛ්‍යාව*** | ***සාර්ථකව නිමා කල සංඛ්‍යාව*** |
|---|---|---|
| 2006 | 21 | 17 |
| 2007 | 17 | 11 |
| 2008 | 35 | 21 |
| 2009 | 34 | 13 |
| 2010 | 47 | 21 |
| 2011 | 32 | |
| 2012 | 54 | |
| 2013 | 80 | සම්පූර්ණ කිරීමට |
| 2014 | 92 | නියමිත |



2011, 2012 සහ 2013 කණ්ඩායම් වල ප්‍රතිඵල අවසන් වීමට නියමිතව ඇති අතර, 2014 වර්ෂයේදී සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන් සිසුන් 165 ක් අතුරින් 92 දෙනෙකු උපාධිය හැදෑරීමට සුදුසුකම් ලැබූහ. ඉහත සඳහන් ප්‍රස්ථාරයට අනුව විද්‍යාවේදී වැවිලි කළමනාකරණ උපාධිය සඳහා තිබෙන ඉල්ලුම සැලකිය යුතු ලෙස ධනාත්මකව වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. සාර්ථකව උපාධිය අවසන් කරන අයදුම්කරුවන් සඳහා සහතික පත්‍රය ජාතික වැවිලි කළමනාකරණ ආයතනය හා වයඹ විශ්ව විද්‍යාලය ඒකාබද්ධව පිරිනමනු ලබයි. මේ අනුව වයඹ විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව උපාධි පාඨමාලාවක් පිරිනැමීමට ලැබීම ආයතනය ලද මහත් ගෞරවයකි.

## 4.6 පවත්වන ලද බාහිර විභාග

වැවිලි කළමනාකරණයට සම්බන්ධ විවිධ විෂයන්ට අදාලව බාහිර විභාග පැවැත්වීම ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ එක් පරමාර්ථයකි. 1987 වසරේ සිට විවිධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන වලට මෙම සේවාව සපයනු ලැබේ. සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් පහත විස්තර සපයා ඇති පරිදි විවිධ ආයතන වල බඳවා ගැනීම් සහ උසස් කිරීම් සඳහා විභාග 11 ක් පවත්වා ඇත.

| ආයතනය | විභාග ගණන | අපේක්ෂකයින් ගණන | ආදායම (රු.) |
|---|---|---|---|
| 1. ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 06 | 127 | 199,158.25 |
| 2. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 01 | 54 | 81,285.00 |
| 3. පොල් පර්යේෂණ ආයතනය | 03 | 50 | 68,283.50 |
| 4. තේ පර්යේෂණ ආයතනය | 01 | 04 | 43,368.68 |
| **මුළු ගණන** | **11** | **235** | **392,094.75** |

## 4.7 පුස්තකාල පහසුකම්



වැවිලි කළමනාකරණයට සම්බන්ධ තේ, රබර්, පොල්, උක්, කජු, ගිණුම්කරණය, පොදු කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, ක්‍රමෝපාය කළමනාකරණය, ධනාත්මක චින්තනය, කාල කළමනාකරණය, ඵලදායිතාවය, කර්මාන්ත සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය, තත්ත්ව කළමනාකරණය වැනි විෂයන්ට අදාල පොත් 6,000 කින් පමණ පුස්තකාලය සමන්විත වේ.

මෙහි බැහැර දීමේ හා විමර්ශනය කිරීමේ අංශ දෙකම ඇත. දිගු කාලීන අධ්‍යාපනික පාඨමාලා හදාරන

අයට හා ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට පුස්තකාලයේ පොත පත පරිහරණය කල හැකි අතර, කෙටි කාලීන වැඩසටහන් සඳහා සහභාගී වන අයට, බාහිර සම්පත්දායකයින්ට සහ මෙම ප්‍රදේශයේ පාසල් සිසුන්ට විමර්ශන අංශය පරිහරණය කල හැක.

## 4.8 ආයතනීය වෘත්තීය සාමාජිකත්වය

1987 අංක 05 දරණ පාර්ලිමේන්තු පනතෙහි සඳහන් කොන්දේසි සහ නිර්ණායක වලට අනුකූලව සුදුසුකම් ලත් වැවිලි විධායකයින් සඳහා ආයතනීය වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීම මේ වර්ෂය තුළදී ද පවත්වා ගෙන යන ලදී. අදාළ කාණ්ඩ යටතේ අනුමත කරන ලද මුළු සාමාජිකත්ව සංඛ්‍යාව පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ගරු සාමාජිකයින් | - | 20 |
| පූර්ණ සාමාජිකයින් | - | 198 |
| ආශ්‍රිත සාමාජිකයින් | - | 18 |
| ශිෂ්‍ය සාමාජිකයින් | - | 02 |
| **මුළු ගණන** | - | **238** |

## 4.9 ප්‍රකාශන

ආයතනය විසින් වර්ෂයක් තුළදී වැවිලි කළමනාකරණය පිළිබඳ සඟරාවෙහි වෙළුම් 02 ක් සහ පුවත් ලිපියෙහි වෙළුම් 04ක් නිකුත් කරනු ලැබේ. බෝග පර්යේෂණ ආයතන වල විද්‍යාඥයින්, විශ්ව විද්‍යාල වල දේශකවරුන් සහ පළපුරුදු දක්ෂ වතු පාලකයින් විසින් සකස් කරන ලද ලිපි වලින් මෙම සඟරාව සමන්විත විය. කතුවරුන්ගේ වර්ණ ඡායාරූප සහ වෙනත් අදාල වර්ණ ඡායාරූප ඇතුළත් කොට ආයතනයේ සඟරාව වෙනත් මුහුණුවරකින් ඉදිරිපත් කොට ඇත. මෙහි සංස්කාරක මණ්ඩලය, වයඹ විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය එස්. ජේ. බී. ඒ. ජයසේකර මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගණකාධිකරණ අංශයේ මහාචාර්ය කේ. බී. එම්. ෆොන්සේකා මහතා, රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ගාමිණී සෙනෙවිරත්න මහතා, පොල් පර්යේෂණ ආයතනයේ ශාක කායික විද්‍යා අංශයේ අංශ ප්‍රධානී ආචාර්ය එස්. රණසිංහ මහත්මිය සහ තේ පර්යේෂණ ආයතනයේ උපදේශක අංශයේ අංශ ප්‍රධානී බී. ඒ. ඩී. සමන්සිරි මහතා යන අයගෙන් සමන්විත විය. ප්‍රධාන සංස්කාරක වූයේ රබර් පර්යේෂණ ආයතනයේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය එන්. යෝගරත්නම් මහතාය. තත්ත්වයෙන් උසස් වූ මෙම සඟරාව සඳහා වැවිලි ක්ෂේත්‍රයේ සහ වැවිලි අංශය හා සම්බන්ධ වෙනත් ආයතනවල විධායකයින්ගෙන් විශාල ඉල්ලුමක් පැවතුනි.




## 4.10 ආයතනය තුල ඇති පහසුකම්



දේශීය හා විදේශිය මට්ටමේ අධ්‍යාපනයට සරිලන පරිදි නවීකරණය හා ඉහළ නැංවීම තුලින් පුහුණු ආයතනයකට අවශය වන පරිදි සියළුම යටිතල පහසුකම් වලින් මෙම ආයතනය සමන්විත වේ. අතුරුගිරියෙහි පිහිටි එහි ප්‍රධාන කාර්යාලය සතුව වායු සමනය කරන ලද දේශන ශාලා 03 ක් හා එක් වරකට 200 දෙනෙකුට පමණ ආසන පහසුකම් සැපයිය හැකි විශාල ශ්‍රවණාගාරයක්, 6,000 කට වැඩි පොත් සංචිතයක් ඇති පුස්තකාලයක් සහ එක් වරකට 60 දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරයක් පවතී. අධ්‍යක්ෂ තුමාගේ නිල නිවස ඇතුළුව කාර්ය මණ්ඩලය සඳහා වූ නිල නිවාස 06 ක් මෙහි පවතී. සංයුක්ත ආයතනය සතුව රථ වාහන 08 ක් ඇති අතර බොහෝමයක් වාහන ක්ෂේත්‍රයේ කටයුතු සඳහා යොදවන බැවින් සැලැස්ම තුළ අන්තර් ගත සියලු වැඩ කටයුතු ඉටු කිරීම සඳහා මෙම ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් වන්නේ නැත. දැනට අබලන් තත්වයේ පවතින වාහන 02 ක් 2014 වර්ෂයේදී ඉවත් කිරීමට බලාපොරොත්තු විය. සභාපතිවරයාගේ කාර්යාලය සහ අධ්‍යක්ෂවරයාගේ කාර්යාලය, පුහුණු අංශය ඇතුළු කාර්යාල ගොඩනැගිල්ල මෑතක දී අළුත්වැඩියා කරන ලද නමුත්, පරිපාලන ගොඩනැගිල්ල අවුරුදු 50 කට වඩා පැරණි බැවින් එය අළුත්වැඩියා කළ යුතුව ඇත.



එබැවින් ඉහත කාර්යාලය සඳහා පරිසර හිතකාමී ගොඩනැගිල්ලක් ඉදි කිරීම ඉතා හදිසි අවශ්‍යතාවයකි. දැනට භාවිතා නොකරන ගොඩනැගිලි ආයතන පරිශ්‍රය

තුල නොමැත. පුහුණු පාඨමාලාවන් සහ පරිපාලන කටයුතු සඳහා වන ගොඩනැගිලි හැරණු විට අනෙක් ගොඩනැගිලි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් පවත්වන කොරියානු පුහුණු පාඨමාලා සඳහා සම්පූර්ණයෙන් යොදවා ඇත.

ආයතනයට අයත් බගවන්තලාව තෙරේසියා වත්තෙහි පිහිටි ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය සතුව ද පුහුණු ආයතනයට අවශ්‍ය පහසුකම් ඇති අතර නවීන තත්වයේ පුහුණු පහසුකම් සඳහා ඉහළ නැංවිය යුතුව ඇත. ශ්‍රවණාගාරයෙහි වරකට 60 දෙනෙකු සඳහා පහසුකම් ඇති අතර, මධ්‍යම පරිමාණයේ දේශන ශාලා දෙකෙහි 100 දෙනෙකුට පමණ අසුන් ගැනීමේ පහසුකම් ඇත. එමෙන්ම 7 දෙනෙකුට පමණ නවාතැන් පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරයක්, විශාල ප්‍රමාණයේ භෝජන ශාලාවක්, කාර්යාල කාමර 3 ක්, පොත් 600 කින් පමණ සමන්විත කුඩා ප්‍රමාණයේ පුස්තකාලයක් පවතින අතර නේවාසිකාගාර කළමනාකරු සඳහා බංගලාවක් සහ 10 දෙනෙකුට පමණ එකවර නවාතැන් ගත හැකි සංචාරක බංගලාවක් තිබේ. මෙම ප්‍රාදේශිය මධ්‍යස්ථානයෙහි භාරකරු නේවාසිකාගාර කළමනාකරු වේ. ඔහුට අමතරව නේවාසිකාගාර සහයක වශයෙන් එක් අයෙක් ඇත. වෙනත් කිසිදු ස්ථිර සේවකයෙක් මෙහි නැත. එබැවින් පුහුණු පාඨමාලා පවතින අවස්ථා වලදී පමණක් අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ඇතිව දෛනික කුලී පදනම මත කම්කරුවන් සේවයට බඳවා ගනී. එමෙන්ම දෛනික කුලි පදනම මත සේවකයින් තිදෙනෙකු සහ එක් මුරකරුවෙකු බඳවා ගෙන ඇත. වර්තමානයෙහි විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් පවත්වනු ලබන කොරියානු පුහුණු පාඨමාලවන් සඳහා සියළුම පහසුකම් නේවාසිකාගාර කළමණාකරුගේ අධීක්ෂණය යටතේ මෙම කාර්ය මණ්ඩලය මඟින් සපයනු ලබයි.



## 4.11 2015 වර්ෂය සඳහා කාර්ය දර්ශනය

ආයතනයේ පාර්ශවකරුවන්, අභ්‍යන්තර සම්පත් දායකයින් සහ පසුගිය පාඨමාලා හැදෑරුවන්ගේ අදහස් හා යෝජනා පදනම් කර ගනිමින් 2015 වර්ෂය සඳහා කාර්ය දර්ශනය සකසා ඇත. ඊට අමතරව වැවිලි අංශයේ පුහුණු අවශ්‍යතා නිරාවරණය කර ගැනීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ රැස්වීමක් ද ආයතනයෙහි පවත්වන ලදී. මෙහිදී බොහොමයක් දෙනාගේ මතය වූයේ තේ, රබර් සහ පොල් කුඩා වතු හිමියන් සඳහා වැඩසටහන් වැඩිපුර පැවැත්විය යුතු බවයි. තවද, නවතම පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට සහ පවතින පුහුණු වැඩසටහන් සඳහා ප්‍රසිද්ධියක් ලබා දීමට වැවිලි ආයතන හා සම්බන්ධ මානව සම්පත් කළමණාකරුවන් සමඟද රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

ඒ අනුව 2015 වර්ෂය සඳහා වූ කාර්ය දර්ශනයට පහත වැඩසටහන් ඇතුලත් කරන ලදී.

- අධ්‍යාපනික / වෘත්තීය වැඩසටහන් - 17
- කළමනාකරණ සංවර්ධන වැඩසටහන් - 07

- කුසලතා සංවර්ධන වැඩසටහන් - 06
- ප්‍රාරම්භක පාඨමාලාවන් - 06

පහත දැක්වෙන වැඩසටහන් "ඉල්ලුමට අනුකූලව සැපයීමට නියමිත වැඩසටහන්" ලෙස කාර්ය දර්ශනයට ඇතුලත් කරන ලදී.

- තාක්‍ෂණික සංවර්ධන වැඩසටහන් - 04
- කම්කරු සංවර්ධන වැඩසටහන් - 03

ඉහත ආදායම් උත්පාදන වැඩසටහන් වලට අමතරව මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන වලින් පහත සඳහන් පුහුණු වැඩසටහන් කුඩා වතු හිමියන් සඳහා පැවැත්වීමට කටයුතු කරන ලදී.

- කුඩා තේ වතු හිමියන් සඳහා - 60
- කුඩා රබර් වතු හිමියන් සඳහා - 50
- කුඩා පොල් වතු හිමියන් සඳහා - 50
- කුඩා උක් වතු හිමියන් සඳහා - 10
- කුඩා කජු වතු හිමියන් සඳහා - 10
- කුඩා තල් වතු හිමියන් සඳහා - 10
- කුඩා කුරුඳු වතු හිමියන් සඳහා - 10

200

## 4.12 පුහුණු වැඩසටහන් වල නව පැතිකඩයන්

2015 කාර්ය දර්ශනයෙහි ඇතුළත් වැඩසටහන් වලට අමතරව වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ පුද්ගල කණ්ඩායම් ඉලක්ක කොට ගත් නව වැඩසටහන් සැලසුම් කිරීමට සහ සැකසීමට අවශ්‍ය කටයුතු 2016 වර්ෂය ආරම්භයේදී පහත පරිදි සිදු කිරීමටද නියමිතය.

(අ) නායකත්වය සහ සන්නිවේදනය විශේෂයෙන් ඉලක්ක කරගනිමින් වැවිලි අංශයේ විධායක නිළධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන්.

(ආ) ආකල්ප සංවර්ධනය සම්බන්ධ වූවැවිලි අංශයේ විධායක නොවන නිළධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන්.

(ඇ) වැවිලි අංශයේ දායකයින් සඳහා අවශ්‍යතාවය මත පදනම් වූ පරිගණක වැඩසටහන්.

(ඈ) විවිධ ආයතනයන්හි ඉල්ලීම පරිදි අදාළ ප්‍රදේශයන්හි පැවැත්වීම සඳහා වැවිලි කළමනාකරණය සම්බන්ධව සකස් කරන ලද වැඩසටහන්.

## 5.0 පරිපාලන අංශය

ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (පාලන), පරිපාලන අංශ ප්‍රධානි ලෙස කටයුතු කරන අතර සාමාන්‍ය පරිපාලන කටයුතු වල වගකීම දරනු ඇත. 2014 වර්ෂයේ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 57 කි. තනතුරු කිපයක් පුරප්පාඩු වී ඇත. නමුත් එම වර්ෂයෙදී එම පුරප්පාඩු පිරවීමට නොහැකි වුයේ එම තනතුරු සඳහා ආයතනය විසින් ඉල්ලා ඇති සුදුසුකම් ඉහල වීමත් ඒ සඳහා ලබා දි ඇති වැටුප තරඟකාරිව එම තනතුරු සඳහා ප්‍රමාණවත් නොවීමත්ය. (උදා:- පුහුණු කිරීමේ නිලධාරි - ගිණුම් හා මූල්‍ය කළමනාකරණය තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබුවද, ඒ සඳහා ප්‍රතිචාර ඉතාමත් පහල මට්ටමක් පැවතුන අතර අයදුම්කරනු ලැබු අයදුම්කරුවන් ද අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොතිබුණි.

දැනට ප්‍රධාන කාර්යාලයේ නේවාසිකාගාරය සඳහා නේවාසිකාගාර කළමනාකරුවෙකු නොමැති බැවින්, එකී කටයුතු ආවරණය කරනු ලබන්නේ වැඩ පරික්ෂක විසිනි. අවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ කාර්ය මාස 06 ක කාලයක් සඳහා පත්කර ඇති කළමනාකරණ සහකාරවරුන්ගෙන් සමන්විත කමිටුවකින් සිදු කෙරෙන අතර එමගින් එම කටයුතු වල වඩාත් කාර්යක්ෂම හා විනිවිද භාවය සහතික වේ. අතුරුගිරියේ සහ බගවන්තලාවේ පිහිටි නේවාසිකාගාර දෙක විසින් පුහුණු වැඩ සටහන් සඳහා නේවාසික පහසුකම් හා ආහාර පාන යනාදිය සපයනු ලබයි. මෙහි පැවැත්වෙන බාහිර පුහුණු වැඩ සටහන් සඳහා එක් අයෙකුගෙන් එක් දිනකට ආහාර සඳහා රු.1,120/- ක මුදලක් අය කෙරෙන අතරල නවාතැන් ගාස්තු සඳහා රු.300/-ක් අය කෙරේ. මෙම ගාස්තු හුදෙක් අදාල පහසුකම් සඳහා පිරිවැය ආවරණය කර ගැනීම සඳහා පමණි. කෙසේ වෙතත්, මෙම මධ්‍යස්ථාන වලින් සැපයෙන ආහාර සහ නවාතැන් පහසුකම් පිළිබඳව එම පහසුකම් ලබාගත් අය විසින් ප්‍රසංශාත්මකව කතා කරනු ලබයි. මෙම පහසුකම් වල තත්වය තව දුරටත් දියුණු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

සමාලෝචිත වර්ෂය තුලදී ද ආයතනය විසින් කොරියානු රැකියා අපේක්ෂකයන් සඳහා පහසුකම් සැපයීම සිදු කරන ලදි. මෙම තත්වය මත ස්ථිර කාර්ය මණ්ඩලයට අමතරව කොන්ත්‍රාත් පදනම මත සේවකයින් කීප දෙනෙකු බඳවා ගැනීමට සිදුව ඇත. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද අතර නව තනතුරු සඳහා වැටුප් ගෙවීම සිදු කරනුයේ කොරියානු වැඩ සටහන් මගින් උපයා ගත් ආදායමෙනි.

## 6. මූල්‍ය අංශය

මූල්‍ය අංශ ප්‍රධානී ලෙස ගණකාධිකාරී කටයුතු කරනු ලබයි. මෙම අංශය සඳහා කළමනාකරණ සහකාරවරුන් 05 දෙනෙකුගෙන් සමන්විතව ගණකාධිකාරී වෙත සහාය ලබා දෙයි.
මෙම අංශය ආයතනයේ වාර්ෂික අයවැය වාර්තාව පිළියෙල කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සැකසීම සහ මූල්‍ය කළමනාකරණය සඳහා වගකීම් දරනු ලබයි.
පාලක මණ්ඩලය සහ අනෙකුත් අවශ්‍ය ආයතන සඳහා මූල්‍ය තොරතුරු යාවත්කාලීනව සැලසුම් මෙම මූල්‍ය අංශය විසින් සිදු කල යුතුවේ.

ආයතනයේ අභ්‍යන්තර විගණක තනතුර 2014 වසරේ අග කාල සීමාවේදී අනුමත විය. එමනිසා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර නිලධාරීවරයාගේ සේවය ආයතනයට ලබා ගැනීමට සිදුවිය. ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුව හා අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුව නියෝජනය සඳහා ගණකාධිකාරීවරයා කටයුතු කර ඇති අතර, ඔහු ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුවේ නිලධාරි ලෙස කටයුතු කර ඇත. ආයතනයට අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගන්නා තුරු අභ්‍යන්තර විගණකගේ කාර්යභාරය වර්තමානයේ අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබයි.

පසුගිය වසරේ පරිදි ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙනම නිලධාරීවරයෙකු හෝ ප්‍රසම්පාදන අංශයක් ආයතනය සතු නොවීය.

ප්‍රසම්පාදන කටයුතු පරිපාලන අංශය මගින් හසුරුවන අතර, කොන්ත්‍රාත්තු ප්‍රදානය, ගිවිසුම් අත්සන් කිරීම, මුදල් ගෙවීම් කටයුතු සිදු කිරීම සහ ප්‍රසම්පාදනයන් පරීක්ෂාවට ලක් කිරීම වැනි ක්‍රියාකාරකම් මූල්‍ය අංශය විසින් සිදු කරනු ලබයි.

## 7. මූල්‍යමය හා භෞතික කාර්ය දර්ශනය

2014 වසරේ සාරාංශගත අයවැයගත හා සත්‍ය කාර්ය දර්ශනය (රුපියල් මිලියන)

| අයවැයගත මුදල | අයවැය | සත්‍ය | කාර්ය දර්ශනය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් (ක්ෂය කිරීම් ඇතුලත්ව) | 82.88 | 69.91 | 84% |
| ප්‍රාග්ධන වියදම් | 30.20 | 26.47 | 87% |
| මුළු වියදම | 113.08 | 96.38 | 85% |
| මුළු උපයන ලද ආදායම | 33.650 | 25.32 | 75% |
| පුනරාවර්තන ප්‍රදාන | 30.50 | 24.79 | 81% |
| ප්‍රාග්ධන ප්‍රදාන | 25.00 | 21.50 | 86% |
| මුළු ආදායම | 86.48 | 70.84 | 82% |
| ආදායම උපදවන වැඩ සටහන් ගණන | 49 | 32 | 65% |
| පුහුණුවන්නන්ගේ සංඛ්‍යාව ( ආදායම් උපදවන වැඩ සටහන්) | 1030 | 993 | 96% |
| ශක්‍යතා වර්ධන වැඩ සටහන් සංඛ්‍යාව | 200 | 355 | 177.5% |
| සහභාගිවූවන් සංඛ්‍යාව | 8,000 | 25,100 | 313.5% |

විමර්ෂණයට ලක් කරන වර්ෂය තුල වැය කල මුළු පුනරාවර්තන වියදම රුː මිලියන 69.91 ක් වූ අතර, එය අයවැය ගත මුදලෙන් 84% ක ප්‍රගතියක් වාර්තා කර ඇත. මෙම වියදම තුළ රුː මිලියන 15.828 ක ප්‍රාග්ධන වත්කම් වල ක්ෂය කිරීම තුළ ක්‍රමක්ෂය ඇතුලත්ව කර ඇත.

ප්‍රාග්ධන වත්කම් සඳහා රුː මිලියන 30.2 ක් වූ අයවැයෙන් රුː මිලියන 26.47 ක් වැය කර 84% ක ප්‍රගතියක් වාර්තා ගත කර ඇත.

පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදාන ලෙස රුː මිලියන 24.79 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රුː මිලියන 21.5 ක මුදලක් මහා භාණ්ඩාගාරය විසින් ප්‍රදානය කර ඇත. ආයතනය විසින් කුඩා වතු හිමියන්ගේ ශක්‍යතා වර්ධන වැඩ සටහන් සඳහා රුː මිලියන 9.98 ක මුදලක් වැය කරන ලදී. මෙම මුදල මහා භාණ්ඩාගාරය ප්‍රාග්ධන වියදම් යටතේ ප්‍රදානය කරන ලදී.


ආයතනය වතු සේවකයින් සඳහා ආදායම් උපයන වැඩ සටහන් 32 ක් පවත්වා රුː මිලියන 10.36 ක ආදායම් උපයන ලදී. තවද වැඩ සටහන් 355 ක් කුඩා වතු හිමියන් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මූල්‍යනය මත නොමිලේ පවත්වන ලදී.


වැවිලි සේවකයින් 993 ක් පුහුණුව ලද අතර, එය ඇස්තමේන්තුගත සංඛ්‍යාව මත 96% ක ප්‍රගතියකි. කුඩා වතු හිමියන් සම්බන්ධයෙන් ගත් කල 25100 දෙනෙකු 2014 වර්ෂයේදී පුහුණු විය. එය ඇස්තමේන්තුගත සංඛ්‍යාව සමග ගත් කල 313% ක ප්‍රගතියකි.

### 2014 වර්ෂය තුළ ආදායම් ප්‍රභේද (රුː මිලියන)

| ආදායම් මාර්ගය | 2014 | 2013 | වෙනස |
|---|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | 24.792 | 18.744 | 32.2% |
| රාජ්‍ය ප්‍රදාන මත විලම්භිත ආදායම | 20.837 | 16.751 | 23.7% |
| පුහුණු ආදායම් | 10.037 | 11.572 | (13.2%) |
| ආයතනයේ පහසුකම් කුලියට දීම මඟින් | 6.219 | 6.569 | (5.3%) |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයෙන් ලද ආදායම | 7.823 | 8.247 | (7.8%) |
| වෙනත් ආදායම් | 1.237 | 0.837 | 47.7% |
| මුළු ආදායම | 70.946 | 62.722 | 12.9% |

ඉහත වගුව අනුව 2014 වර්ෂය තුළ උපයන ලද පුහුණු ආදායම, මුළු අදායමෙන් 14% කි. 2013 වසර සමග සැසඳීමේදී එය අඩු වීමකි. ආදායමෙන් වැඩි කොටසක් රජයේ ප්‍රදාන මඟින් උපයනු ලබයි. එය 2013 වර්ෂයේදී 57% ක් වූ අතර, 2014 වසරේ 64% දක්වා වැඩි වී ඇත.




**2014 වසරේ ප්‍රාග්ධන වියදම් (රුː මිලියන)**

| ප්‍රාග්ධන වියදම් | අයවැය | සත්‍ය | ප්‍රගතිය |
|---|---|---|---|
| ප්‍රාග්ධන භාණ්ඩ නවීකරණය, පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 6.80 | 6.63 | 97.5% |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 11.90 | 9.93 | 83.4% |
| දුරස්ථ අධ්‍යාපන සංවර්ධනය | 1.50 | - | - |
| ශක්‍යතා සංවර්ධන වැඩසටහන් | 10.00 | 9.98 | 99.8% |
| එකතුව | 30.20 | 26.54 | 87.8% |

ආයතනය විසින් ප්‍රාග්ධන වියදම් සඳහා රුː මිලියන 26.54 ක් වැය කර ඇත. එහි ප්‍රගතිය 87.8% කි. වර්ෂය තුළ සිදු කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- පුහුණු ගොඩනැගිල්ල නවීකරණය හා අළුත්වැඩියාව
- නේවාසිකාගාරය සඳහා මේස හා පුටු මිලදී ගැනීම
- ශ්‍රවණාගාරය සඳහා වායු සමීකරණ සවි කිරීම
- කුඩා වතු හිමියන් සඳහා ශක්‍යතා වර්ධන වැඩ සටහන් 355 ක් පැවැත්වීම


**කුඩා වතු හිමියන් සඳහා පවත්වන ශක්‍යතා සංවර්ධන වැඩසටහන් (රුː මිලියන)**

| ශක්‍යතා වර්ධන වැඩසටහන් පැවැත්වූ ක්ෂේත්‍රය | වැඩසටහන් ගණන | සහභාගීවූවන් ගණන | වැඩසටහන් පිරිවැය / ආදායම |
|---|---|---|---|
| රබර් | 172 | 14.105 | 5.203 |
| තේ | 102 | 6,329 | 2.351 |
| පොල් | 54 | 3,270 | 1.755 |
| උක් | 11 | 547 | 0.276 |
| කජු | 10 | 508 | 0.188 |
| කුරුඳු | 6 | 341 | 0.208 |
| එකතුව | 355 | 25,100 | 9.985 |

***ඌණතාවය/ අතිරික්තය***


2014 වර්ෂය තුළ ආයතනය රුː 1,030,263/- ක අතිරික්තයක් උපයා ඇත. එය 2013 වර්ෂය හා සැසඳීමේදී රුː මිලියන 3.452 ක අඩු වීමක් පෙන්නුම් කරයි. වත්කම් වල හා නව ප්‍රත්‍යාගණන අගයන්ට අනුව ක්ෂය පිරිවැය ගණනය හේතුවෙන් මෙම අඩු වීමට හේතු පාදක විය.

| අවුරුද්ද | ඌණතාවය/අතිරික්තය |
|---|---|
| 2009 | (1.318) |
| 2010 | 4.780 |
| 2011 | (1.248) |
| 2012 | (4.597) |
| 2013 | 4.482 |
| 2014 | 1.030 |




2014 වසරේදී ශුද්ධ වත්කම් අගය රු: මිලියන 122.218 ක් දක්වා වැඩි විය. එය 2013 වර්ෂයේදී රු: මිලියන 24.619 කි. ශුද්ධ වත්කම් වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් බලපාන කරුණු වනුයේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කිරීම මගින් රු. මිලියන 96.657 ක ශුද්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වාර්තා වීමය.

**ශුද්ධ වත්කම් ( 2009 සිට 2014)**



## 8. පසුගිය වසරට සාපේක්ෂව ප්‍රගතිය

පසුගිය වසරේ ආදායම රුː මිලියන 62.7 ට සාපේක්ෂව මේ වසරේදී රුː මිලියන 70.94 ක ආදායමක් ලගා කර ගැනීමට හැකි විය.

2014 වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම් වශයෙන් රුː මිලියන 69.915 ක් වැය කල අතර, එය පසුගිය වර්ෂයේ පුනරාවර්තන වියදම වූ රුː මිලියන 58.24 ට සාපේක්ෂව 20% ක වැඩි වීමකි.

මහා භාණ්ඩාගාරය විසින් 2013 වර්ෂය සඳහා රුː මිලියන 18.744 ක් පුනරාවර්තන ප්‍රදාන ලෙසද රුː මිලියන 23.10 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙසද ලබා දෙන ලදී. එය 2014 වර්ෂයේ දී රුː මිලියන 24.792 ක් දක්වා වැඩි කර ඇති අතර, එය පසුගිය වසර හා සසඳන විට 32.26% ක ප්‍රගතියකි. ප්‍රාග්ධන ප්‍රදාන රුː මිලියන 21.5 ක් දක්වා අඩු කර ඇති අතර, එය 2013 වර්ෂය හා සසඳන කල්හි 7.4% ක අඩු වීමකි.

ආදායම් උපදවන වැඩ සටහන් ප්‍රමාණය 22 සිට 32 දක්වා වැඩි වූ අතර, ධාරිතා සංවර්ධන වැඩ සටහන්ද 236 සිට 355 දක්වා වර්ධනය වී ඇත. එමනිසා 2013 වර්ෂය තුළ 12,921 ක් වූ සහභාගී වූවන් සංඛ්‍යාව ,2014 වර්ෂයේදී 26,093 දක්වා වැඩි වීමක් දක්නට ලැබුණි.

2014 මුළු වෘත්තීය සාමාජිකයින් සංඛ්‍යාව 238 දක්වා වැඩි වී ඇත.
වැව්ලි කළමනාකරණය සඳහා වූ විවිධ විෂයන්ට සම්බන්ධ පුස්තකාල පොත් පිළිවෙලින් 6,000 ක් හා 600 ක් වශයෙන් අතුරුගිරිය ප්‍රධාන මධ්‍යස්ථානයේ හා බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ඇති කුඩා පුස්තකාලයේ ඇත.

2014 වර්ෂයේදී රුː මිලියන 122.32 ක් දක්වා වැඩි වී ඇත. එය පසුගිය වර්ෂය හා සැසදීමේදී 396% ක වර්ධනයක් පෙන්නුම් කරයි. ආයතනයේ වත්කම් 2014 වර්ෂය තුළදී වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලදී. එම නිසා එහි ප්‍රතිපලයක් ලෙස රුː මිලියන 96.675 ක් ශුද්ධ ප්‍රතිලාභයක් විමර්ශනයට භාජනය කල වර්ෂයේදී දක්නට ලැබිණ,

මූල්‍ය තත්ව ප්‍රකාශය අනුව වර්ෂය අවසානයේ ජංගම වත්කම් 16.7% ක වැඩි වීමක් හා ජංගම වගකීම් 27% ක වැඩි වීමක් පෙන්නුම් කරයි.

සේවක ප්‍රතිලාභ වෙනුවෙන් රුː මිලියන 7.21 ක වෙන් කිරීමක් ආයතනය විසින් වෙන් කර ගිණුම් ගත කර ඇත.

## 9.0 ආයතනය විසින් මුහුණ දුන් ගැටළු

පෙර වර්ෂයන්හි මෙන්ම 2014 වර්ෂයේදී සිදුවු ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලිය මගින් ඇති වූ බාධක සඳහා මුහුණ දීමට 2014 වර්ෂයේදී සිදු විය. පුහුණු අංශ සේවක හිඟය මින් ප්‍රධාන ගැටළුවකි. පුහුණු අංශයෙහි කාර්ය මණ්ඩලය 06 දෙනෙකු පමණක් සේවයේ යෙදී සිටී. එනම් පුහුණු විශේෂඥ (කළමනාකරණ), පුහුණු විශේෂඥ (ගිණුම් හා මූල්‍ය පාලන), පුහුණු විශේෂඥ (කෘෂි ආර්ථික), පුහුණු නිළධාරී (කළමනාකරණ), පුහුණු නිලධාරී (කෘෂි ආර්ථික) සහ එක් පුහුණු සහකාරවරයෙකු පමණි. 2014 වසරේදී තනතුරු ගණනාවක් පිරවීමට නොහැකි වී ඇත.

සමහර වැව්ලි සමාගම් ඔවුන්ගේ විධායක ශ්‍රේණියේ නිලධාරීන් අපගේ දීර්ඝ කාලීන අධ්‍යාපනික පාඨමාලා සඳහා සහභාගී කරවීමට මැලිකමක් දක්වන ලදී. මෙය ආයතනය මුහුණ දීමට සිදුවු විශාල බාධකයන් ලෙස දැක්විය හැක. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ විධායක නිලධාරීන් අඛණ්ඩව පුහුණු වැඩ සටහන් වල දේශන සඳහා නිදහස් කිරීම හේතුවෙන් ඔවුන්ගේ නිෂ්පාදනය හා වතු වල පරිපාලන කාර්යයන් සඳහා බලපෑම් ඇතිවීමය. ඒ හේතූන් නිසා ආයතනයේ අධ්‍යාපනික පාඨමාලා පැවැත්වීමේ ක්‍රමය නිරන්තරයෙන් වෙනස් කිරීමට භාජනය වී සති අන්තයේ පාඨමාලා වැඩි ප්‍රමාණයක් සංශෝධනය කිරීමට සිදු වී ඇත.

මෙය ප්‍රධාන සාධකයක් වීම හේතුවෙන් ඩිප්ලෝමා පාඨමාලා දුරස්ථ අධ්‍යාපනික ක්‍රමය දක්වා වෙනස් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

වසර 60 කට වඩා ඉපැරණි ගොඩනැගිල්ලක් 1980 ගණන් වලදී කාර්යාල සංකීර්ණයක් බවට පත් කිරීමෙන් ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණය නිමවා ඇත. එමනිසා එය අළුත්වැඩියා කිරීමේ තත්වයෙන් ඔබ්බට ගොස් ඇත. නව කාර්යාල ගොඩනැගිල්ලක් සාදා ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදු කල යුතුය.

වර්තමානයේදී ආයතනය සතු වාහන 08 න් 06 ක් අවුරුදු 15 ක් ඉක්මවා ධාවනය කරන ලද ඒවාය. පෙජරෝ ජීප් රථය අවුරුදු 25 කට වඩා පැරණිය. කලින් සඳහන් කල පරිදි දිවයිනේ විවිධ ප්‍රදේශ වල කුඩා වතු හිමියන් වෙනුවෙන් වැඩ සටහන් පැවැත්වීම ඒ සඳහා සහභාගී වීමට මෙම පවතින වාහන නුසුදුසු තත්වයේ පවතී. ආයතනයේ සේවාදායකයින් හට කාර්යක්ෂම සේවාවක් සැපයීම සහතික වීම සඳහා මෙම වාහන වලට නව වාහන හුවමාරු කිරීමක් සිදු කල යුතුය.

තවද ආයතනයේ පවතින ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ප්‍රවාහණය සඳහා දැනට පවතින වාහන සුදුසු තත්වයේ නොපවතී. එම උපකරන නියමිත පරිදි අසුරා ආරක්ෂිත ලෙස ප්‍රවාහනය නොකිරීමෙන් කැඩී බිඳී යා හැකිය. එම නිසා ජංගම පුහුණු ඒකකය සඳහා සුදුසු වාහනයක් මිලදී ගැනීම සඳහා අවශ්‍යතාවයක් මතු වී ඇත.

## 10.0 නිගමන

2004 වසරෙන් පසු ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලිය හේතුවෙන් ආයතනයට නොයෙකුත් බාධක හා අවහිරතා සඳහා මුහුණ දීමට සිදු වුවද ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන සමහර පාර්ශවයන්ගේ මැදිහත් වීම මත ආයතනය අක්‍රීය සේ පැවති කාල සීමාව තුල නේවාසික පුහුණු වැඩ සටහන් ස්ථාපිත කිරීමට හැකි විය. ඒ තුලින් පසුගිය 2013 වසරට සාපේක්ෂව ආයතනයේ මුල්‍යමය සහ භෞතික වශයෙන් ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත. ආයතනය අපේක්ෂා කල වැඩ සටහන් ප්‍රමාණය 249 ක් වුවද එය 387 ක් දක්වා වැඩි කර ගැනීමට හැකි විය. මෙය 55.4% ක ප්‍රගතියක් අපේක්ෂා කල ප්‍රමාණය සමඟ සැසඳීමේදී පෙන්නුම් කරයි.

ආයතනයට තෘප්තිමත් වීමට කාරණයක් වශයෙන් කුඩා වතු හිමියන් හා කම්කරුවන් සඳහා වැඩසටහන් පැවැත්වීමට 50.4% කින් පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩි කර ගැනීමට හැකි වී ඇත. මෙම අගය කුඩා වතු හිමියන් හා කම්කරුවන්  සඳහා වැඩ සටහන් වලට ඉහල ඉල්ලුමක් පවතින බව පෙන්නුම් කෙරේ. කුඩා වතු හිමියන් හා වතු කම්කරුවන් සඳහා වඩ වඩාත් වැඩ සටහන් පැවැත්වීම කෙරෙහි හැකියාව පැවතියද, පුහුණු අංශයේ නිලධාරී හිඟය මත මෙය සිදු කිරීම සඳහා හැකියාවක් නොමැති වී ඇත.

රුː මිලියන 1.030 ක ශුද්ධ අතිරික්තයක් වර්ෂයේ වියදම් හා ආදායම් අතර දැක ගැනීමට හැකි වූ අතර, ශුද්ධ වත්කම්හි අගය 2014 වර්ෂයේදී රුː මිලියන 24.619 සිට රුː මිලියන 122.32 දක්වා වැඩි වී ඇත.

තවද තේ, රබර්, පොල්, උක් සහ කජු කුඩා වතු හිමියන් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කර ගෙන රු. මිලි. 9.98 ක් වැය කර වැඩ සටහන 355 ක් පැවැත්විය. කුඩා වතු හිමියන් සහ වතු කම්කරුවන් පුහුණු වැඩ සටහන් වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කිරීමට ඊලඟ වර්ෂයේදී ද  බලාපොරොත්තු වේ. මෙම තොරතුරු පදනම්ව ආයතනයේ සමාලෝචිත වර්ෂයේදී මුල්‍ය සහ භෞතික ප්‍රගතිය පිලිබඳ සෑහීමකට පත්විය හැකි අතර, ආයතනයේ සේවකයන්ගේ උත්සාහය හා පාලක මණ්ඩලයේ නිසි උපදෙස් මත 2015 වසරේ සැලසුම් කල ඉලක්කයන් සපුරා ගැනීමට බලාපොරොත්තු වේ.

ආයතනයේ සභාපති වශයෙන් පාලක මණ්ඩලය වෙනුවෙන්ද කළමනාකාරීත්වය වෙනුවෙන්ද ආයතනයේ 2014 වර්ෂය තුල ක්‍රියාකාරකම් සාර්ථකව ඉටු කර ගැනීමට උපරිම සහයෝගය දැක්වු සෑම දෙනා සඳහා අවංක ස්තූතිය හා කෘතගුණ දැක්වීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



**දීප්ති අශෝක අබේවික්‍රම**

**සභාපති**

# මූල්‍ය වාර්තා

# පටුන

**මූල්‍ය වාර්තා**


| | පිටුව |
|---|---|
| 2014 මුල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් | 40 - 48 |
| මුල්‍ය තත්ව ප්‍රකාශනය | 49 - 50 |
| මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය | 51 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 52 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 53 |
| අයවැය සහ සත්‍ය කාර්ය | 54 |
| දේපල පිරියත හා උපකරණ ලේඛනය | 55 |
| අස්පෘෂ්‍ය වත්කම් | 56 - 57 |
| 2014 වර්ෂය සඳහා ගිණුම් සටහන් | 58 - 68 |
| මූල්‍ය හා භෞතික ප්‍රගතියේ ඉස්මතු කිරීම | 69 |
| විගණකාධිපති වාර්තාව | 70 |

## ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
## 2014 මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්

### 01. මූලික ගිණුම්කරණ සංකල්ප

ආයතනයේ සියළු වගකීම් පියවීමට ප්‍රමාණවත් වන සේ අරමුදල් රජයේ ප්‍රදාන, පුහුණු වැඩසටහන් අධ්‍යාපනික පාඨමාලා, උපදේශකත්ව පැවැරුම්, වෘත්තීය සාමාජිකත්ව දායක අරමුදල් සහ ප්‍රකාශන අලෙවියෙන් ලැබේ යැයි සැලකිල්ලට ගෙන ආයතනයේ පාලක මණ්ඩලයේ උපදෙස් මත අවිච්ින්න පැවැත්ම සංකල්පය මත පදනම්ව ගිණුම් සැකසීම සිදු කරයි.

### 02. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හී සාරාංශයන්

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට අදාල මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් කර ඇත.

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති විශේෂයෙන් සඳහන් නොකරන සෑම අවස්ථාවකදීම අඛණ්ඩව සියලුම ප්‍රකාශිත වර්ෂයන් සඳහා අදාල වේ.

**පිළියෙල කිරීමේ පදනම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව උපචිත පදනම සැලකිල්ලට ගෙන මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත. මූලික ගණනය කිරීමේ පදනම සඳහා වත්කම්හි ඓතිහාසික පිරිවැයට ප්‍රත්‍යාගණය ගැලපීම අදාල කර ගනු ලැබේ.
මූල්‍ය වාර්තා සඳහා අවිච්ච්ින්න පැවැත්ම පදනම සැලකිල්ලට ගෙන පිළියෙල කරන අතර, මෙම පදනම වර්ෂය පුරාම අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ.

**2.1 වැඩ, සේවා සහ සැපයුම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයන්ට අනුකූලව වැඩ, සේවා සහ සැපයුම් වලදී ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කරනු ලබයි.

**2.2 අස්පෘෂ්‍ය වත්කම්**

අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගත් මිලෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත ප්‍රත්‍යාගණනය අඩු කර වෙනම වාර්තා කරනු ලැබේ. ක්‍රමක්ෂය අය කරනු ලබන්නේ සරල මාර්ග පදනම මත වත්කමෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සැලකිල්ලට ගෙනය. සෑම වර්ෂයක් අවසානයේදීම ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්‍රම ක්ෂය සමාලෝචනය කරනු

ලබන අතර, වත්කමෙහි වටිනාකම්හි අපහායනයක් සිදු වුවහොත් එම වෙනස පිරික්සුම් කල අගය පදනම්ව ගිණුම් ගත කරනු ලැබේ.

**පරිගණක මෘදුකාංග**

ගිණුම් සැකසීම, වැටුප් සැකසීම, පුහුණු සංඛ්‍යා ලේඛණ, හා වත්කම් කළමනාකරණය පිළිබඳ මෘදුකාංග පරිගණක ක්‍රියාකාරී පද්ධතියේ කොටසක් නොවන නිසා අස්පෘෂ්‍ය වත්කම් ලෙස සලකනු ලැබේ. මෙම වත්කම් වසර 04 කින් ලියා හැරීම සිදු කරනු ලැබේ.

**දුරස්ථ ඉගෙනුම් පාඨමාලා සංවර්ධන පිරිවැය**

ජාතික වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා දුරස්ථ ඉගෙනුම් සංවර්ධන පිරිවැය අස්පෘෂ්‍ය වත්කම් ලෙස සලකන අතර, එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය අවු. හතරකට සීමා වේ.

| විස්තරය | පරිගණක මෘදුකාංග | දුරස්ථ අධ්‍යාපන පාඨමාලා සංවර්ධන පිරිවැය |
|---|---|---|
| ප්‍රයෝජනවත් ජීව කාලය | වසර 04 | වසර 04 |

## 2.3 කුඩා වතු හිමියන් සඳහා ධාරිතා වර්ධන වැඩ සටහන්

මෙම කුඩා වතු හිමියන් සඳහා පවත්වන වැඩ සටහන් ආයතනයට ප්‍රාග්ධන ආයෝජනයක් හා සංවර්ධන වියදමක් ලෙස සලකනු ලැබේ. ඒ තුලින් ආයතනයේ කීර්තිභාවය වැඩි වීමට හේතු පාදක වී ඇති අතර, කුඩා වතු හිමියන්ගේ ධාරිතාවන් වර්ධනය වන අතර, මේ තුලින් වැවිලි ක්ෂේත්‍රයේ හා ආයතනයේ නිෂ්පාද්‍යතාවය වැඩි දියුණු වීමට හේතු පාදක වී ඇත.

අවසාන පාරිභෝගිකයාගේ දෑතට ගුණාත්වයෙන් ඉහල නිෂ්පාදනයන් ලබා දීමේ පෙරදැරිව කුඩා වතු හිමියන්ගේ කෘෂිකාර්මික දැනුම අපේක්ෂිත මට්ටමට වර්ධනය සඳහා කඩිනමින් අවශ්‍යතාවයක් සේ සලකා මෙම වැඩ සටහන් සංවිධානය කර ඇත.

මෙම වැඩසටහන්හි අපේක්ෂිත ප්‍රතිඵල බලපෑම වර්ෂයන් තුළදී උපලබ්ධි වන බවට උපකල්පනය කරන අතර, එම නිසා ආයෝජිත අගය එම වර්ෂයේදීම ලියා හරිනු ලැබේ.

2014 වසරේ ජාතික අයවැය මූල්‍යනය කිරීම මගින් රුඃ මිලියන 9.98 ක් මුදලක් වැය කර කුඩා වතු හිමියන්ගේ සහ කම්කරුවන්ගේ දැනුම වර්ධනය කර ඇත.

## 2.4 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ඓතිහාසික පිරිවැයට සමුච්චිත ක්ෂය අඩු කර පෙන්නුම් කරයි. වත්කම ක්‍රියාකාරී තත්වයට ගෙන එන තෙක් වූ සෑම ඍජු පිරිවැයක්ම සහ සැලකිය යුතු මට්ටමේ මෙම ඓතිහාසික පිරිවැයෙහි අන්තර්ගත කර ඇත.

### 2.4.1 ක්ෂය කිරීම

ක්ෂය කිරීම සරල මාර්ග ක්‍රමය පදනම්ව ගණනය කරනු ලබන අතර, ගිණුම් සඳහා ක්ෂය ඇස්තමේන්තුගත කරනු ලබන්නේ වත්කමේ ජීවිත කාලය සැලකිල්ලට ගෙන පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කිරීම මඟිනි.

පොදුවේ උපයෝගී කර ගනු ලැබූ ක්ෂය අනුපාතයන් පහත පරිදිවේ.

| | |
|---|---|
| නිදහස් ගොඩනැගිලි | 5% |
| කාර්යාලීය ලී බඩු | 10% |
| කාර්යාලීය උපකරණ | 20% |
| මෝටර් වාහන | 20% |
| යන්ත්‍ර හා පිරියත | 20% |
| මාර්ග පද්ධති, ජල සැපයුම්, විදුලිය හා දුරකථන, යටිතල වත්කම් | 10% |
| පුස්තකාල පොත් | 10% |
| විවිධ උපකරණ | 25% |
| ඉඩම් වැඩි දියුණු කිරීම් | 10% |

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ වියදම් සඳහා පහත සඳහන් දෑ ඇතුලත් කර ඇත.

- මාර්ග සංවර්ධන වියදම්
- ජල සැපයීමේ වියදම්
- විදුලි සැපයීමේ වියදම්

පරිගණක මෘදුකාංග නැඩ සටහනේ වටිනාකම යටිතල වත්කම් සිට අස්පෘෂ්‍ය වත්කම් වලට මාරු කර ඇත. මෙම වත්කමේ වටිනාකම රුː 160,000/- ක් විය. එමනිසා වත්කම් ක්ෂය කිරීම් අගය 2014 දී 10% සිට 25% දක්වා වෙනස් වීමකට භාජනය විය.

මෙම මාරු කිරීම මත ක්‍රමක්ෂය අගය රුː 24,000/- කින් වැඩි වී ඇත. එය අස්පෘෂ්‍ය වත්කම් සටහනේ පෙන්වා ඇත.

#### අගය කිරීමේ පදනම

මෝටර් වාහන හා ඉඩම් හැර සියළුම ස්ථාවර වත්කම් පිරිවැය ක්‍රමය යටතේ ක්ෂය කිරීම් ගිණුම් ගත කෙරේ. වාහන සඳහා ප්‍රත්‍යාගණන ගිණුම් පදනම යොදා ගන්නා ලද අතර, ඉඩම් සඳහා ක්ෂය කිරීමක් සිදු කරනු නොලැබේ.

### 2.4.2 අපහරණය කිරීම

අපහරණය කිරීමෙන් ලබන ලාභය හෝ පාඩුව නිර්ණය කරනු ලබන්නේ වත්කම් විකිණීමෙන් ලැබෙන මුදලෙන් වත්කම්හි රුගෙන එන වටිනාකම හා සැසදීමෙනි. මෙය ආදායම් වාර්තාවේ ඇතුලත් කරනු ලැබේ.

## 2.4.3 ප්‍රත්‍යාගණනය

#### (අ) මෝටර් වාහන

අළුතින් මිලදී ගත් වාහන දෙක හැර ආයතනයේ සියළුම මෝටර් වාහන 2012 අගෝස්තු 23 වන දින වෘත්තීය වාහන තක්සේරුකරුවෙකු විසින් ප්‍රත්‍යාගණනය කරන ලදී. මෙමගින් ජනිත වූ ප්‍රත්‍යාගණන ලාභය රුඃ 7,833,012.66 ක් ප්‍රත්‍යාගණන සංචිතය තුල ඇතුලත් කර ඇත. එමනිසා මුළු ප්‍රත්‍යාගණන සංචිතය රුඃ 10,584,233.03 දක්වා වැඩි වී ඇත. ප්‍රත්‍යාගණනය පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

| | | | | |
|---|---|---|---|---|
| තක්සේරුකරුගේ නම | :- | ඩී.බී. ද සිල්වා මහතා | | |
| සුදුසුකම් | :- | වෘත්තීය වාහන තක්සේරුකරු | | |
| තක්සේරු කල දිනය | :- | 2012 අගොස්තු 23 | | |
| තක්සේරු වටිනාකම | :- | 32-4086 ජීප් රථය | - | රු. 1,450,000/- |
| | | 61-2361 බස් රථය | - | රු. 950,000/- |
| | | 250-3161 කැබ් රථය | - | රු. 1,700,000/- |
| | | 58-3717 කැබ් රථය | - | රු. 1,700,000/- |
| | | 250-2603 කැබ් රථය | - | රු. 1,550,000/- |
| | | 250-2604 වෑන් රථය | - | රු. 1,950,000/- |

#### (ආ) ලී බඩු, කාර්යාලීය උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ වෙනත් උපකරණ

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2014.01.01 දිනට අතුරුගිරිය කාර්යාලයේ පැවති ඉහත සඳහන් වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලදී. දේපල, පිරියත හා උපකරණ වල විස්තරාත්මක

තොරතුරු ප්‍රත්‍යාගණන ගැලපුම් සටහන් සමගින් මූල්‍ය වාර්තා පිටු අංක ඇතුලත් කර ඇත. ශුද්ධ ප්‍රත්‍යාගණන ලාභය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ඇතුලත් කර ඇත.
වත්කම් තක්සේරුව පිළිබඳ අවශ්‍ය තොරතුරු ඒ ඒ කාණ්ඩ යටතේ පහත සඳහන් කර ඇත.

තක්සේරුකරුගේ නම :- කේ. ඒ. ඩී. එන්. ජේ. නානායක්කාර මහතා
සුදුසුකම් :- ප්‍රාදේශීය තක්සේරුකරු
තක්සේරු කල දිනය :- 2014 ජනවාරි 01
ස්ථානය :- අතුරුගිරිය

| වත්කම් වර්ගය | 2014.01.01 දිනට රැගෙන එන දල වටිනාකම (ගත් මිල) (රු: 000) | ප්‍රත්‍යාගණිත අගය (රු: 000) | ප්‍රත්‍යාගණන අතිරික්තය/අලාභය (රු: 000) |
|---|---|---|---|
| කාර්යාල උපකරණ | 17,611 | 3,438 | (2,635) |
| ලී බඩු සහ සවි කිරීම් | 5,129 | 5,669 | 3,604 |
| යන්ත්‍රෝපකරණ | 1,004 | 335 | 32 |
| වෙනත් උපකරණ | 2,893 | 859 | (228) |

**(ඇ) ගොඩනැගිලි**

බගවන්තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය සහ යුධ හමුදා 7 වෙනි ඉංජිනේරු සේවා බලකායට භුක්තිය භාර දීමට නියමිත ඇති සේවක නිල නිවාස තුන හැර අනෙකුත් සියළු ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2014.01.01 දිනට තක්සේරු කරන ලදී.

තක්සේරුකරුගේ නම :- කේ. ඒ. ඩී. එන්. ජේ. නානායක්කාර මහතා
සුදුසුකම් :- ප්‍රාදේශීය තක්සේරුකරු
තක්සේරු කල දිනය :- 2014 ජනවාරි 01

| වත්කම් වර්ගය | 2014.01.01 දිනට රැගෙන එන දල වටිනාකම (රු: 000) | ප්‍රත්‍යාගණන අගය (රු: 000) | ප්‍රත්‍යාගණන අතිරික්තය/අලාභය (රු: 000) |
|---|---|---|---|
| ගොඩනැගිලි | 74,424 | 134,074 | 95,902 |

ප්‍රත්‍යාගණන අතිරික්තය රු: 96,075,557.18 කින් වැඩි වීම හේතුවෙන් ශුද්ධ වත්කම් අගය රු: 123,085,110.31 දක්වා වැඩි වී ඇත.

**(ඈ) ප්‍රත්‍යාගණනය නොකරන ලද වත්කම්**

පහත සඳහන් වත්කම් 2014 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය නොකරන ලදී.

| | 2014.01.01 දිනට රැගෙන එන දළ වටිනාකම රුː 000 | රැගෙන එන ශුද්ධ වටිනාකම 2014.01.01 දිනට රුː 000 |
|---|---|---|
| ඉඩම් හා ඉඩම් සංවර්ධන කටයුතු | 1,727 | 1,727 |
| ගොඩනැගිලි (බගවන්තලාව ගොඩනැගිලි හා සේවක නිල නිවාස 03) | 14,855 | 4,969 |
| උපකරණ (බගවන්තලාව) | 937 | 262 |
| ලී බඩු (බගවන්තලාව) | 512 | 45 |
| යටිතල වත්කම් | 14,855 | 12,272 |
| පුස්තකාල පොත් | 2,247 | 588 |
| වෙනත් උපකරණ (මුළුතැන් ගෙයි උපකරණ) | 919 | 97 |
| **එකතුව** | **31,037** | **19,960** |

**2.4.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

ආයතනය වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය පවත්වා ආර්ථිකමය වශයෙන් භාවිතයට ගත නොහැකි ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා නිර්දේශ කරනු ලබයි.

**2.4.5 ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් අත්පත් කර ගත් ඉඩමේ වර්තමාන තත්වය**

හෙක්ටයාර 1.9499 ක භූමිය හා නිල නිවාස 03 ක් ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත පවරන ලදී. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(A) ඡේදයට අනුව භුක්තිය භාර දී ඇත. පරිච්ඡේද අංක 5 යටතේ ගැසට් පත්‍රය මෙම අත්පත් කර ගැනීම ප්‍රසිද්ධ කිරීම සඳහා නියමිතව ඇත. රුː මිලියන 55 ක වන්දියක් මේ වෙනුවෙන් ආයතනයට ලැබීමට නියමිතය.

## 03. යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ඇති තැම්පතු

යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් සේවා සපයන ආයතනය වෙත ඉදිරිපත් කර ඇති තැම්පතු මෙයට ඇතුලත්වේ.

## 04. තොගයන්

ආයතනයේ ප්‍රකාශන, මුද්‍රණ උපකරණ, ලිපි ද්‍රව්‍ය, කාර්යාල අවශ්‍යතා, ටයර් සහ වෙනත් පාරිභෝග පරිහරණ ද්‍රව්‍යයන් තොගයේ අන්තර්ගත වේ. මෙම තොග ගණනය කිරීම ප්‍රථම

නිකුතු ක්‍රමය සැලකිල්ලට ගැනීමෙනි. තේ සංවර්ධන ව්‍යාපෘතියෙන් ප්‍රදානය කල පොත් ප්‍රකාශිත පොත් තොගයේ ඇතුලත් කර ඇත.

## 05. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ සඳහා මුදල් සහ අතුරුගිරිය ලංකා බැංකු ශාඛාවේ ජංගම ගිණුමේ ශේෂයන් ඇතුලත්ය.

## 06. කෙටි කාලින ආයෝජන

ආයතනය විසින් උපයන ලද අතිරේක ආදායම් ආයතනයේ ඉදිරි සංවර්ධන වැඩ සටහන් සඳහා ප්‍රයෝජනයට ගැනීමට සහ බැඳීම් මූල්‍යනය කිරීම සඳහා කෙටි කාලීන ඉල්ලුම් තැම්පතු ස්ථාවර තැම්පතු සහ ඉතිරි කිරීමේ තැම්පතු ලෙස ලංකා බැංකුවේ අතුරුගිරිය ශාඛාවේ තැම්පත් කර ඇත.

## 07. සංචිතයන්

### 7.1 ප්‍රත්‍යාගණන සංචිතයන්

ආයතනයේ වාහන 2012 දී ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලද අතිරික්තය සංචිතයේ ඇතුලත්ව ඇත.
පිටු අංක හි සඳහන් පරිච්ඡේද 2.4.3 (ඈ) හි සඳහන් වත්කම් හැර ගොඩනැගිලි සහ අනෙකුත් උපකරණ ප්‍රත්‍යාගණනය කර ඇත. ප්‍රත්‍යාගණනයන්ගේ ශුද්ධ ලාභය වන රුඃ 107,259,790/- ක් ලෙස 2014.12.31 දිනට සංචිත වල ඇතුලත්ව ඇත. සංචිත වල සංචලනයන් ශුද්ධ වත්කම් විචලනයන් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

## 08. සේවක විශ්‍රාමික ප්‍රතිලාභ

ආයතනයේ සේවයෙන් විශ්‍රාම යන සියළුම සේවකයින් සඳහා විශ්‍රාමික පාරිතෝෂිත වෙන් කර ඇත. ඉදිරි වර්ෂය තුල ගෙවීමට ඇති පාරිතෝෂිත දීමනා ජංගම වත්කම් ගිණුමේ අන්තර්ගත කර ඇත.
ආයතනය විසින් ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂිතයට සමාන මුදලක් ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කර ඇත.

## 09. විලම්භිත ආදායම

### 9.1 ප්‍රකාශන තොග පරිත්‍යාගයන්

තේ සංවර්ධන ව්‍යාපෘතිය මඟින් පරිත්‍යාග කරන ලද ප්‍රකාශන තොගයේ වටිනාකම විලම්භිත ආදායම් ගිණුමට මාරු කර ඇත. වර්ෂය තුලදී උපලබ්ධි ආදායම ප්‍රකාශිත වර්ෂයේ ආදායම් ලෙස ආදායම් විස්තරයට ඇතුලත් කරනු ලැබේ.

### 9.2 ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රාග්ධන ප්‍රදාන

ප්‍රාග්ධන සංවර්ධන වියදම් සඳහා සැලකිය යුතු මුදලක් ජාතික අය වැය දෙපාර්තමේන්තුව මඟින් ප්‍රදානය කරන අතර මෙම මුදල විලම්භිත ආදායම් ගිණුමේ ඇතුලත් කර ඇත. වත්කම්හී ප්‍රයෝජනවත් ජීවිත කාලය සැලකිල්ලට ගෙන වර්ෂයට වැය වන මුදල හා ඒ හා සමාන මුදලක් ආදායම් වාර්තාවට තාර්කික පදනමින් වාර්ෂිකව ක්‍රමානුකූලව උපලබ්ධි කරනු ලබයි. වත්කම්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත සඳහන් වේ.

| නිදහස් ගොඩනැගිලි | වසර 20 |
|---|---|
| කාර්යාලීය ලී බඩු | වසර 10 |
| කාර්යාලීය උපකරණ | වසර 05 |
| මෝටර් වාහන | වසර 05 |
| යන්ත්‍ර හා පිරියත | වසර 05 |
| මාර්ග පද්ධති, ජල සැපයුම්, විදුලිය හා දුරකථන (යටිතල පහසුකම්) | වසර 10 |
| පුස්තකාල පොත් | වසර 10 |
| විවිධ උපකරණ | වසර 04 |
| ඉඩම් වැඩි දියුණු කිරීම | වසර 10 |

## 10.0 කෙටි කාලීන වෙන් කිරීම් සහ අසම්භාව්‍යන්

### 10.1 අසම්භාව්‍ය වගකීම්

ශ්‍රව්‍ය දෘෂ්‍ය නිළධාරී ලෙස ආයතනයේ සේවය කල ඒ. සී. කේ. අත්තනගොඩ මහතා විසින් විනය කරුණු හේතු කොට ගෙන තමාව සේවයෙන් පහ කිරීම පිළිබඳව නීතිමය පියවර ගෙන ඇත. මෙම හේතුවෙන් ගිණුම් ප්‍රකාශිත වර්ෂය තුලදී රු. 608,901/- ක්වූ අසම්භාව්‍ය වගකීමක් ඔහුගේ වැටුප්, වේතන හා අනෙකුත් ගෙවීම් වෙනුවෙන් වෙන් කර ඇත. මේ වන විට මෙම නඩුව කම්කරු උසාවියේ විමර්ෂණය වෙමින් පවතී. 2014 වර්ෂය අවසාන වන විට රු. 3,084,934.60 ක මුදලක් වෙන් කිරීමක් සිදු කර ඇත.

### 10.2 අඩමාන ණය සඳහා වෙන් කිරීම

වර්ෂය අවසාන ණයගැති ශේෂය සඳහා 2% ක අඩමාණ ණය වෙන් කිරීමටක් සිදු කර ඇත.

## 11.0 පුහුණු ආදායම

### 11.1 කෙටි කාලීන වැඩ සටහන්

පුහුණු කාල සීමාව මාස 06 කට වඩා අඩු නම් එම වැඩ සටහන කෙටි කාලීන වැඩ සටහනක් ලෙස සලකනු ලැබේ. පුහුණු වැඩ සටහන ආරම්භක වර්ෂයේදීම මෙහි මුළු ආදායම හා වියදම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

### 11.2 දිගු කාලීන පුහුණු වැඩ සටහන් (ඉදිරියට යන පුහුණු වැඩ සටහන්)

පුහුණු කාල සීමාව මාස 06 ට වඩා වැඩි වන්නේ නම් එම වැඩ සටහන් දිගු කාලීන වැඩ සටහන් (ඉදිරියට යන වැඩ සටහන්) ලෙස සලකනු ලැබේ. මෙහි පුහුණු වැඩ සටහන් වල ආරම්භක මාසය හා වැඩ සටහන් කාල සීමාව සැලකිල්ලට ගෙන සමානුපාතික පදනම උපයෝගී කර ගෙන ආදායම් හා වියදම් කාලීන පදනම මත ගිණුම් ගත කෙරේ.

## 12. බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානය

බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් සහ වියදම වෙන වෙනම මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පෙන්නුම් කර ඇත. 2014 වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු: 4,060,763/- ක් ලෙස වාර්තා වී ඇත.

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

**මූල්‍ය තත්ව ප්‍රකාශනය රු.000**

2014 දෙසැම්බර් 31 දිනට

| **වත්කම්** | **සටහන්** | **31/12/2014** | **31/12/2013** |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 2,191 | 326 |
| ලැබිය යුතු දෑ | 2 | 4,354 | 6,606 |
| තොගයන් | 3 | 935 | 842 |
| කලින් ගෙවීම් | 4 | 529 | 548 |
| වෙනත් ජංගම වත්කම් | 5 | 22,937 | 18,185 |
| | | **30,946** | **26,507** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ලැබිය යුතු දෑ | 6 | 921 | 919 |
| දේපල, පිරියත හා උපකරණ | 7 | 181,165 | 84,368 |
| අස්පෘශ්‍ය වත්කම් | 8 | 1,021 | 406 |
| ජංගම නොවන වෙනත් වත්කම් | 9 | 612 | 612 |
| | | **183,719** | **86,305** |
| | | | |
| **මුළු වත්කම්** | | **214,665** | **112,812** |
| | | | |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු දෑ | 10 | 14,612 | 12,509 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 11 | 3,085 | 2,477 |
| සේවක ප්‍රතිලාභ | 12 | 1,663 | 254 |
| | | **19,360** | **15,240** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දිගු කාලීන ප්‍රතිපාදන | 13 | 67,433 | 66,770 |
| සේවක ප්‍රතිලාභ | 14 | 5,547 | 6,183 |
| | | **72,980** | **72,953** |
| **මුළු වගකීම්** | | **92,340** | **88,193** |
| | | | |
| **ශුද්ධ වත්කම්** | | **122,325** | **24,619** |
| | | | |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| **රජය දායක වූ ප්‍රාග්ධනය හා වෙනත් රාජ්‍ය අස්ථිත්වයන්ගේ දායකත්වය** | 15 | 38,386 | 38,386 |
| **සංචිත** | 16 | 107,260 | 10,584 |
| **සමුච්චිත අතිරික්තය / (ඌණතාවය)** | 17 | (23,321) | (24,351) |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | **122,325** | **24,619** |

පිටු අංක 40 සිට 48 දක්වා සහ පිටු අංක 51 සිට 68 දක්වා සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනුකූලතා කොටසක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇති බවට සහතික වෙමි.

එල්. ඩී. ජේ. ප්‍රියන්ත
ගණකාධිකාරී

මෙම ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටින අතර, මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

ආචාර්ය නිශ්ශංක ඉද්දගොඩ
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
15.07.2015

ඒ. ඒ. එම්. අමරසිංහ
සභාපති

**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය**

**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය රු.000**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| **ආදායම** | සටහන් | 31/12/2014 රු: | නැවත ප්‍රකාශිත 31/12/2013 රු: |
|---|---|---|---|
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 18 | 24,792 | 18,744 |
| විලම්බිත රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ආදායම | 19 | 20,837 | 16,751 |
| පුහුණු ආදායම් | 20 | 10,037 | 11,573 |
| නේවාසික පහසුකම් කුලියට දීම තුලින් ලද ආදායම් | 21 | 6,219 | 6,570 |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් | 22 | 7,824 | 8,247 |
| පොලී ආදායම් | 23 | 1,038 | 526 |
| වෙනත් ආදායම් | 24 | 199 | 311 |
| **මුළු ආදායම** | | **70,946** | **62,722** |
| | | | |
| **වියදම්** | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 25 | 19,452 | 17,304 |
| සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය භාවිතය | 26 | 2,910 | 3,510 |
| නඩත්තු සහ අළුත්වැඩියා | 27 | 3,670 | 2,716 |
| සන්නිවේදන සහ උපයෝගිතා සේවා | 28 | 7,117 | 5,994 |
| පුහුණු වියදම් ධාරිතා පුහුණු වැඩසටහන් ඇතුළුව | 29 | 14,375 | 11,755 |
| නේවාසික පහසුකම් කුලියට දීම සඳහා වූ වියදම් | 30 | 1,923 | 2,159 |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම් | 31 | 3,763 | 2,937 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 32 | 15,833 | 10,495 |
| වෙනත් වියදම් | 33 | 873 | 1,372 |
| **මුළු වියදම්** | | **69,916** | **58,242** |
| කාල සීමාවට අදාල අතිරික්තය / (ඌනතාවය) | | 1,030 | 4,480 |
| **පාලන අස්ථිරත්වයේ හිමිකරුට අදාල කොටස** | | **1,030** | **4,480** |

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය

**ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය**

*2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා*

| ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය රු 000' | | | | | මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය |
|---|---|---|---|---|---|
| විස්තරය | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිතය | රඳවා ගත් ලාභ සමුච්චිත අතිරික්ත/ (හිඟය) | එකතුව | |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | **38,386** | **10,584** | **(28,834)** | **20,136** | **20,136** |
| 2013 වසර සඳහා අතිරික්තය / (හිඟය) | - | - | 4,483 | 4,483 | 4,483 |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,386** | **10,584** | **(24,351)** | **24,619** | **24,619** |
| | | | | | |
| වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය | - | 96,676 | - | 96,676 | 96,676 |
| 2014 වසර සඳහා අතිරික්තය / (හිගය) | - | - | 1,030 | 1,030 | 1,030 |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,386** | **107,260** | **(23,321)** | **122,325** | **122,325** |

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් සිදු වූ මුදල් ප්‍රවාහයන්** | 31/12/2014 | 31/12/2013 |
|---|---|---|
| | රු: 000 | රු: 000 |
| **වර්ෂය සඳහා අතිරික්තය (හිඟය)** | 1,030 | 4,482 |
| **අඩු කලා පොලි ආදායම** | 1,038 | 526 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (8) | 3,956 |
| ***මුදල් නොවන සංචලනයන්*** | | |
| ක්ෂය (සටහන 02) | 15,552 | 10,312 |
| ක්‍රමක්ෂය | 277 | 183 |
| විශ්‍රාමික පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 773 | (4) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභ / අලාභ | - | 161 |
| විලම්බිත ආදායම් | (20,837) | (16,751) |
| අඩමාණ ණය වෙන් කිරීම වැඩි වීම | 67 | - |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම්) / අඩුවීම් | 1,729 | (1,493) |
| තොගයන් හි (වැඩිවීම්) / අඩුවීම් | (93) | 41 |
| කලින් ගෙවුම් හි (වැඩිවීම්) / අඩුවීම් | 19 | (101) |
| අනෙකුත් ජංගම වත්කම් හි (වැඩිවීම්) / අඩුවීම් | (167) | (11) |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි වැඩිවීම් / (අඩුවීම්) | 2,103 | 5,882 |
| කෙටි කාලින වෙන් කිරීම් වැඩිවීම් / (අඩුවීම්) | 608 | 575 |
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ ප්‍රවාහය*** | 23 | 2,750 |
| ***ආයෝජන ක්‍රියාකාරකම්*** | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | (16,067) | (16,759) |
| යටිතල වියදම් සඳහා ගෙවීම - විදුලිය | - | (220) |
| අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | (500) | - |
| ස්ථාවර / ඉතුරුම් තැන්පතු වල ආයෝජනය කිරීම | (6,272) | (13,437) |
| ඉතුරුම් / ස්ථාරව තැන්පතු මුදල් බවට පත් කිරීම | 2,000 | 3,250 |
| ණය හා අත්තිකාරම් ගෙවීම | (1,166) | (1,549) |
| ණය හා අත්තිකාරම් ලැබීම් | 1,620 | 2,037 |
| පොලි ආදායම් | 727 | 130 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් ලැබීම් | | 138 |
| ***ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය*** | (19,658) | (26,410) |
| ***මූල්‍ය ක්‍රියාකාරකම්*** | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන් | 21,500 | 23,100 |
| ***මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය*** | 21,500 | 23,100 |
| | | |
| ***මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)*** | 1,865 | (560) |
| | | |
| ***මුදල් හා මුදල් සමාන දෑ හි වාර්ෂික ආරම්භක ශේෂය*** | 326 | 886 |
| | | |
| ***මුදල් හා මුදල් සමාන දෑ හි වාර්ෂික අවසාන ශේෂය*** | 2,191 | 326 |
| | | |

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

**අයවැය සහ සත්‍ය කාර්ය සාධනය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 000

| ***ආදායම*** | | ***සත්‍ය*** | ***අයවැය*** | ***ප්‍රගතිය*** |
|---|---|---|---|---|
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 18 | 24,792 | 30,500 | 81% |
| විලම්බිත රජයේ ප්‍රාග්ධන ප්‍රදනයන්ගෙන් ආදායම | 19 | 10,937 | 12,330 | 89% |
| ශක්‍යතා වර්ධන වැඩ සටහන් | 19 | 9,900 | 10,000 | 99% |
| පුහුණු ආදායම් | 20 | 10,037 | 17,072 | 59% |
| නේවාසික පහසුකම් කුලියට දීම | 21 | 6,219 | 7,200 | 86% |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් | 22 | 7,824 | 7,500 | 104% |
| පොලි ආදායම් | 23 | 1,038 | 1,578 | 65% |
| වෙනත් ආදායම් | 24 | 199 | 300 | 66% |
| ***මුළු ආදායම්*** | | **70,946** | **86,480** | **82%** |
| | | | | |
| ***පුනරාවර්තන වියදම්*** | | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 25 | 19,453 | 24,388 | 80% |
| සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය භාවිතයන් | 26 | 2,910 | 5,090 | 57% |
| නඩත්තු සහ අලුත්වැඩියා | 27 | 3,670 | 3,075 | 119% |
| සන්නිවේදන සහ උපයෝගිතා සේවා | 28 | 7,116 | 11,440 | 62% |
| පුහුණු වියදම් | 29 | 14,375 | 18,500 | 78% |
| පහසුකම් කුලියට දීම සම්බන්ධ වියදම් | 30 | 1,923 | 3,276 | 59% |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම් | 31 | 3,763 | 2,966 | 127% |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 32 | 15,833 | 12,330 | 128% |
| වෙනත් වියදම් | 33 | 873 | 1,815 | 48% |
| **මුළු වියදම්** | | **69,916** | **82,880** | **84%** |
| | | | | |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| ස්ථාවර වත්කම් | | 16,067 | 18,200 | 88% |
| අස්පෘෂ්‍ය වත්කම් | | 500 | 2,000 | 25% |
| ශක්‍යතා වර්ධන වැඩ සටහන් | | 9,900 | 10,000 | 99% |
| **මුළු ප්‍රාග්ධන වියදම්** | | **26,467** | **30,200** | **88%** |
| | | | | |
| **මුළු වියදම්** | | **96,383** | **113,080** | **85%** |
| භාණ්ඩාගාර ප්‍රදාන | | | | |
| පුනරාවර්තන වියදම් | | 24,792 | 30,500 | 81% |
| ප්‍රාග්ධන වියදම් | | 21,500 | 25,000 | 86% |
| **මුළු ප්‍රදාන** | | **46,292** | **55,500** | **83%** |

## ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

### දේපල පිරියත හා උපකරණ ලේඛනය රු.000

| විස්තරය | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් | ගොඩනැගිලි | යන්ත්‍ර හා පිරියත | උපකරණ | ලී බඩු | වාහන | යටිතල පහසුකම් | පුස්තකාල පොත් | විවිධ උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | | | | | | |
| **2013/01/01 දිනට** | **3,400** | **80,164** | **1,004** | **19,716** | **5,599** | **24,850** | **974** | **2,129** | **3,497** | **141,333** |
| එකතු කිරීම් | - | 4,099 | - | 1,172 | 137 | 739 | 10,257 | 39 | 316 | **16,759** |
| ඉවත් කිරීම් | - | - | - | (2,339) | (95) | - | - | - | - | **(2,434)** |
| ගැලපීම් | - | - | - | | - | | - | - | - | **-** |
| **2013/12/31 දිනට** | **3,400** | **84,263** | **1,004** | **18,549** | **5,641** | **25,589** | **11,231** | **2,168** | **3,813** | **155,658** |
| එකතු කිරීම් | 104 | 6,179 | 1,818 | 2,663 | 1,880 | 455 | 2,246 | 79 | 643 | 16,067 |
| මාරු කිරීම් | (1,777) | - | - | - | | - | 1,377 | - | - | (400) |
| ප්‍රත්‍යාගණනය | - | 134,074 | 335 | 3,438 | 5,669 | - | - | - | 859 | 144,375 |
| ප්‍රත්‍යාගණන ගැලපීම් | - | (74,424) | (1,004) | (17,612) | (5,129) | - | - | - | (2,893) | (101,062) |
| **2014/12/31 දිනට** | **1,727** | **150,092** | **2,153** | **7,038** | **8,061** | **26,044** | **14,854** | **2,247** | **2,422** | **214,638** |
| ක්ෂය වීම් | | | | | | | | | | |
| **සමුච්චිත ක්ෂය 2013/01/01 දිනට** | **382** | **38,660** | **601** | **12,348** | **3,366** | **3,772** | **767** | **1,518** | **1,700** | **63,114** |
| ක්ෂය පිරිවැය | 154 | 2,201 | 101 | 1,846 | 248 | 5,026 | 31 | 68 | 637 | **10,312** |
| ඉවත් කිරීම් | - | - | - | (2,047) | (86) | - | - | - | - | **(2,133)** |
| ක්ෂය ගැලපීම් | - | - | - | - | - | - | - | | - | **-** |
| **සමුච්චිත ක්ෂය 2014/01/01 දිනට** | **536** | **40,861** | **702** | **12,147** | **3,528** | **8,798** | **798** | **1,586** | **2,337** | **71,293** |
| ක්ෂය පිරිවැය | - | 7,009 | 67 | 965 | 585 | 5,159 | 1,257 | 73 | 437 | 15,552 |
| ප්‍රත්‍යාගණන ගැලපීම් | - | (36,252) | (702) | (11,538) | (3,065) | - | - | - | (1,807) | (53,364) |
| මාරු කිරීම් | (536) | - | - | | | - | 528 | - | - | (8) |
| **සමුච්චිත ක්ෂය 2014/12/31 දිනට** | **-** | **11,618** | **67** | **1,574** | **1,048** | **13,957** | **2,583** | **1,659** | **967** | **33,473** |
| **2013/12/31 දිනට ශුද්ධ පොත් අගය** | **2,864** | **43,402** | **302** | **6,402** | **2,113** | **16,791** | **10,433** | **582** | **1,476** | **84,365** |
| **2014/12/31 දිනට ශුද්ධ පොත් අගය** | **1,727** | **138,474** | **2,086** | **5,464** | **7,013** | **12,087** | **12,271** | **588** | **1,455** | **181,165** |

| අස්පෘශ්‍ය වත්කම් රු 000' | | | | | |
|---|---|---|---|---|---|
| වත්කම් වර්ගය | 2013/01/01 දිනට පිරිවැය | එකතු කිරීම් - 2013 | ගැලපීම | අගය අඩු වීම් | 2013/12/31 දිනට පිරිවැය |
| පරිගණක මෘදුකාංග | 50 | - | - | - | 50 |
| දුරස්ථ පුහුණු ඒකක සංවර්ධන ක්‍රම පිරිවැය | 683 | - | - | - | 683 |
| **මුළු අස්පෘශ්‍ය වත්කම්** | **733** | **-** | | **-** | **733** |
| **භාණ්ඩයේ නම** | **2014/01/01 දිනට පිරිවැය** | **එකතු කිරීම් - 2014** | **ගැලපීම** | **අගය අඩු වීම්** | **2014/12/31 දිනට පිරිවැය** |
| පරිගණක මෘදුකාංග | 50 | - | - | - | 50 |
| දුරස්ථ පුහුණු ඒකක සංවර්ධන ක්‍රම පිරිවැය | 683 | - | - | - | 683 |
| පරිගණක චෙක්පත් ලිවීමේ මෘදුකාංගය | - | - | 160 | - | 160 |
| පරිගණක දත්ත සැකසුම් පද්ධතිය - පුහුණු අංශයේ සංඛ්‍යාලේඛණ | - | - | 240 | - | 240 |
| සම්පත් සහ ගබඩා කළමනාකරණ මෘදුකාංගය | - | 500 | - | - | 500 |
| **මුළු අස්පෘශ්‍ය වත්කම්** | **733** | **500** | **400** | **-** | **1,633** |

| වත්කම් වර්ගය | සමුච්චිත ක්‍රමක්ෂය 31/12/2013 | ක්‍රමක්ෂය 2013 | ගැලපීම | අගය අඩු කිරීම් | සමුච්චිත ක්‍රමක්ෂය 31/12/2013 |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 31 | 12 | - | - | 43 |
| දුරස්ථ පුහුණු ඒකක සංවර්ධන ක්‍රම පිරිවැය | 113 | 171 | - | - | 284 |
| **මුළු අස්පෘශ්‍ය වත්කම්** | **144** | **183** | | **-** | **327** |
| | | | | | |
| **වත්කම් වර්ගය** | **සමුච්චිත ක්‍රමක්ෂය 31/12/2014** | **ක්‍රමක්ෂය 2014** | **ගැලපීම** | **අගය අඩු කිරීම්** | **සමුච්චිත ක්‍රමක්ෂය 31/12/2014** |
| පරිගණක මෘදුකාංග | 43 | 6 | - | - | 49 |
| දුරස්ථ පුහුණු ඒකක සංවර්ධන ක්‍රම පිරිවැය | 284 | 171 | - | - | 455 |
| පරිගණක චෙක්පත් ලිවීමේ මෘදුකාංගය | - | 40 | 8 | - | 48 |
| පරිගණක දත්ත පද්ධතිය - පුහුණු සංඛ්‍යාලේඛණ | - | 60 | - | - | 60 |
| සම්පත් සහ ගබඩා කළමනාකරණ මෘදුකාංගය | - | - | - | - | - |
| **එකතුව** | **327** | **277** | **8** | **-** | **612** |

| වත්කම් වර්ගය | 31/12/2013 දිනට රැගෙන එන ශුද්ධ වටිනාකම | 31/12/2014 දිනට රැගෙන එන ශුද්ධ වටිනාකම |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | 7 | 1 |
| දුරස්ථ පුහුණු ඒකක සංවර්ධන ක්‍රම පිරිවැය | 399 | 228 |
| චෙක්පත් ලිවීමේ මෘදුකාංගය | - | 112 |
| පරිගණක දත්ත සැකසුම් පද්ධතිය (පුහුණු සංඛ්‍යා ලේඛණ) | - | 180 |
| සම්පත් සහ ගබඩා කළමනාකරණ මෘදුකාංගය | - | 500 |
| **මුළු අස්පෘෂ්‍ය වත්කම්** | **406** | **1,021** |

**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය**

**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් සටහන් (රු. 000)**

| | | 2014 | 2013 නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| **1** | **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| | | | |
| | **ලංකා බැංකුව අතුරුගිරිය - 3697566** | 2,191 | 326 |
| | | | |
| | | **2,191** | **326** |
| **2** | **ලැබිය යුතු දෑ (කෙටි කාලීන)** | | |
| **2 (ඒ)** | **ණයගැතියෝ** | | |
| | කැලණිවැලි වැවිලි සමාගම | 40 | 7 |
| | ඇල්කඩුව වැවිලි සමාගම | 75 | 75 |
| | වැවිලි නිවාස සංවර්ධන අරමුදල | 165 | 165 |
| | වයඹ විශ්ව විද්‍යාලය | 2 | 109 |
| | එච්. ඒ. පී. අනුෂා මහත්මිය | 29 | - |
| | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 1,477 | 3,192 |
| | ජාතික කඩදාසි සංස්ථාව | 23 | - |
| | තේ මණ්ඩලය | 79 | 27 |
| | කොටගල වැවිලි සමාගම | 6 | - |
| | පොල් පර්යේෂණ ආයතනය | 204 | - |
| | කම්කරු සම්බන්ධතා දෙපාර්තමේන්තුව | - | 69 |
| | තැපැල් දෙපාර්තමේන්තුව | 186 | - |
| | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 70 | 30 |
| | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | - | 109 |
| | මධ්‍යම පරිසර අධිකාරිය | 107 | 547 |
| | පාඨමාලා ගාස්තු | 444 | 473 |
| | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 43 | - |
| | ජල සම්පාදන දෙපාර්තමේන්තුව | 420 | - |
| | එන්.ඩී.එස්.බී. තෙන්නකෝන් මහතා | - | 11 |
| | මොරටුව විශ්ව විද්‍යාලය | - | 278 |
| | **මුළු ණයගැති** | **3,370** | **5,091** |
| | **අඩු කලා - අඩමාණ ණය වෙන් කිරීම** | **67** | **-** |
| | **ශුද්ධ මුළු ණයගැති** | **3,303** | **5,091** |
| **2(බී)** | **සේවක අත්තිකාරම් සහ ණය** | | |
| | ආපදා ණය | 1,009 | 1,465 |

| | | | |
|---|---|---|---|
| | උත්සව ණය | 42 | 39 |
| | සේවකයින්ගේ ජල බිල් | - | 11 |
| | **මුළු සේවක අත්තිකාරම් සහ ණය** | **1,051** | **1,515** |
| | | | |
| | **මුළු කෙටි කාලීන ලැබිය යුතු දෑ** | **4,354** | **6,606** |
| | | | |
| 3 | **තොගයන්** | | |
| | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 156 | 104 |
| | මුද්‍රණ උපකරණ | 411 | 235 |
| | නඩත්තු උපකරණ | 36 | 21 |
| | ටයර් සහ ටියුබ් | 100 | 231 |
| | සුභ සාධන භාණ්ඩ | 14 | 11 |
| | පාරිභෝජන ද්‍රව්‍ය | 11 | 16 |
| | ශිෂ්‍ය භාණ්ඩ | 6 | 6 |
| | ආයතන ප්‍රකාශනය | 196 | 207 |
| | වියලි ආහාර භාණ්ඩ | 5 | 11 |
| | **මුළු තොග** | **935** | **842** |
| | | | |
| 4 | **කලින් ගෙවීම්** | | |
| | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (වාර්ෂික බලපත්‍ර) | 32 | 31 |
| | සීබීජී (පුද්.) සමාගම - සේවා ගිවිසුම | 3 | 10 |
| | මාර්ගස්ථ මුදල් | 5 | - |
| | ශ්‍රී ලංකා රක්ෂණ සමාගම | 70 | 218 |
| | ගෙස්ටෙට්නර් සිලෝන් සමාගම - සේවා ගිවිසුම | - | 15 |
| | බිස්නස් මැෂින් ලිමිටඩ් - සේවා ගිවිසුම | - | 2 |
| | ජාතික රක්ෂණ අරමුදල | 212 | 112 |
| | ජෝන් කිල්ස් - සේවා ගිවිසුම | 3 | - |
| | ලියක්තා පුද්ගලික සමාගම | - | 66 |
| | මෙට්‍රොපොලිටන් කමියුනිකේෂන් ලිමිටඩ් - සේවා ගිවිසුම | - | - |
| | ආදායම් බදු දෙපාර්තමේන්තුව අතිරික්ත බදු | 204 | 94 |
| | **මුළු කලින් ගෙවීම්** | **529** | **548** |
| | | | |
| 5 | **අනෙකුත් ජංගම වත්කම්** | | |
| | | | |
| 5 (ඒ) | **කෙටි කාලීන තැම්පතු** | | |
| | ඉල්ලුම් තැම්පතු - ලංකා බැංකුව අතුරුගිරිය ගිණුම් අංක 8693502 | 1,715 | 1,715 |
| | ඉල්ලුම් තැම්පතු - ලංකා බැංකුව අතුරුගිරිය ගිණුම් අංක | 5,000 | - |
| | ඉල්ලුම් තැම්පතු - ලංකා බැංකුව අතුරුගිරිය ගිණුම් අංක 74689528 | 5,000 | 5,000 |
| | ස්ථාවර තැම්පතු - ලංකා බැංකුව අතුරුගිරිය පාරිතෝෂිත වෙන් කිරීම | 7,558 | 6,437 |
| | ඉල්ලුම් තැම්පතු - ලංකා බැංකුව අතුරුගිරිය ගිණුම් අංක - 74341134 | - | 2,000 |
| | සාමාජික තැම්පතු ගිණුම -ස්ථාවර තැම්පතු ගිණුම් අංක 74175590 | 894 | 763 |
| | සාමාජික තැම්පතු ගිණුම - ඉතිරි කිරීමේ ගිණුම් | 152 | 131 |
| | අයවිය යුතු පොලී ගිණුම - - ලංකා බැංකුව අතුරුගිරිය | 1,498 | 1,187 |

| | | | |
|---|---|---|---|
| | **මුළු කෙටි කාලීන තැම්පතු** | **21,817** | **17,233** |

| | | | |
|---|---|---|---|
| **5 (බී)** | **ආරක්ෂිත තැම්පතු** | | |
| | එන්.ඩී.එස්.බී. තෙන්නකෝන් මහතා ගිණුම් අංක 1 - 0053-03-1521-4 | 11 | 11 |
| | පී.එන්. පෙරේරා මහතා ගිණුම් අංක 1 - 0053-03-0542-1 | 28 | 25 |
| | සී.එස්. ලියනගේ මිය ගිණුම් අංක 1 - 0053-03-0314-3 | 3 | 3 |
| | ජී. රාජපක්ෂ මිය ගිණුම් අංක 1 - 0053-03-0319-4 | 3 | 3 |
| | ඩබ්.ඩී.එස්. හෙට්ටිආරච්චි මිය ගිණුම් අංක 1 - 0053-03-0617-7 | 2 | 2 |
| | එල්.ඩී.ජේ. ප්‍රියන්ත මහතා ගිණුම් අංක - 8634723 | 41 | 34 |
| | නිශාමිණී ඉලංගන්තිලක මිය ගිණුම් අංක - 74046706 | 14 | 7 |
| | වෛද්‍ය ආධාර තැම්පතු ගිණුම් ජාතික ඉතිරි කිරීමේ බැංකුව අතුරුගිරිය | 1,018 | 867 |
| | **මුළු ආරක්ෂිත තැම්පතු** | **1,120** | **952** |

| | | | |
|---|---|---|---|
| | **මුළු වෙනත් ජංගම වත්කම්** | **22,937** | **18,185** |

| | |
|---|---|
| **6** | **ලැබිය යුතු දෑ - දීර්ඝ කාලීන** |

| | | | |
|---|---|---|---|
| | **ආපදා ණය (වර්ෂයකට වඩා වැඩි)** | **921** | **919** |

| | | | |
|---|---|---|---|
| **7** | **දේපල පිරියත සහ උපකරණ** | **181,165** | **84,368** |

| | | | |
|---|---|---|---|
| **8** | **අස්පෘශ්‍ය වත්කම්** | **1,021** | **406** |

| | |
|---|---|
| **9** | **වෙනත් ජංගම නොවන වත්කම්** |

| | | | |
|---|---|---|---|
| **9 (ඒ)** | **යටිතල පහසුකම් සඳහා තැම්පතු** | | |
| | තැපැල් දෙපාර්තමේන්තුව | 14 | 14 |
| | ලංකා ගෑස් සමාගම | 13 | 13 |
| | ලංකා විදුලිබල මණ්ඩලය | 577 | 577 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් (ප්‍රධාන කාර්යාලය) | 6 | 6 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් - (ප්‍රාදේශිය කාර්යාලය - බගවන්තලාව) | 2 | 2 |
| | **මුළු වෙනත් ජංගම නොවන වත්කම්** | **612** | **612** |

| | |
|---|---|
| **10** | **ගෙවිය යුතු දෑ** |

| | | | |
|---|---|---|---|
| **10 (ඒ)** | **ණයහිමියෝ** | | |
| | ජෝන් කීල්ස් ඔටෝමේෂන්ස් පුද්ගලික සමාගම | - | 372 |
| | මාර්ග සංවර්ධන අධිකාරිය | 4,921 | 4,921 |

| | | | |
|---|---|---|---|
| | හොරණ වැවිලි පුද්ගලික සමාගම | 10 | 10 |
| | රුවන් ටේඩි සෙන්ටර් | 175 | 175 |
| | ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය | - | 50 |
| | විද්‍යා හා තොරතුරු තාක්ෂණ ආයතනය | 25 | - |
| | පී වයි එස් මෘදුකාංග | - | 144 |
| | දුලිත ප්‍රචාරණ | 1 | 1 |
| | ශ්‍රී ලංකා යුධ හමුදා 7 වෙනි රෙජිමේන්තුව | 373 | 373 |
| | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | - | 6 |
| | බගවන්තලාව දකුණ ග්‍රාමීය සංවර්ධන සමිතිය | 1,367 | 10 |
| | කොරතොට ග්‍රාමීය සංවර්ධන සමිතිය | 2,486 | - |
| | **මුළු ණයහිමි** | **9,358** | **6,062** |

| | | | |
|---|---|---|---|
| **10 (බි)** | **උපචිත වියදම** | | |
| | දුරකථන ගාස්තු | 84 | 38 |
| | විදුලි ගාස්තු | 235 | 136 |
| | ඉන්ධන සහ ලිහිසි තෙල් - ඩබ්.ඒ. ප්‍රේමනාත් | 141 | 234 |
| | වාහන නඩත්තුව | 125 | 56 |
| | කොන්ත්‍රාත් සහ තාවකාලික සේවක වැටුප් - (දෙසැම්බර්) | 127 | 135 |
| | මුද්දර බදු (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව) | 3 | - |
| | ගමන් සඳහා යැපුම් දීමනාව | 7 | 17 |
| | අතිකාල දීමනා - (දෙසැම්බර්) | 57 | 101 |
| | වාර සගරාව සහ පුවත්පත් - උපුල් ලක්ෂ්මන් මහතා | 3 | 1 |
| | සේවක භාරකාර අරමුදල - (දෙසැම්බර්) | 43 | 29 |
| | සේවක අර්ථ සාධක අරමුදල - (දෙසැම්බර්) | 319 | 211 |
| | ආරක්ෂක සේවා ගාස්තු - (දෙසැම්බර්) | 187 | 186 |
| | දීමනා | 107 | 6 |
| | වැටුප් - මඩුල්සිමා වැවිලි සමාගම | 31 | 50 |
| | නිවාඩු දින ගෙවීම් (දෙසැම්බර්) | 25 | 4 |
| | කාර්ය මණ්ඩල දේශන ගාස්තු ජා.වැ.ක.ආ. | - | 2 |
| | වෛද්‍යාධාර - (ජාතික ඉතිරි කිරීමේ බැංකුව) | 106 | 88 |
| | පුහුණු වැඩ සටහන් සඳහා දේශන ගාස්තු ගෙවීම | 118 | 461 |
| | මුද්‍රණ වියදම් | 18 | 44 |
| | ප්‍රකාශන - යෝගරත්නම් මහතා | - | 33 |
| | වෘත්තිය සංගමයේ ගෙවීම් | - | - |
| | කුඩා වතු හිමියන්ගේ වැඩ සටහන් | 481 | 512 |
| | බාහිර විභාග ගාස්තු | 54 | 122 |
| | ගොඩනැගිලි උපකරණ | - | 14 |
| | පාරිභොගික භාණ්ඩ | - | 4 |
| | ජල ගාස්තු | 53 | - |
| | දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව - එකතු කල අගය මත බදු | - | 505 |
| | දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව - ජා.ගො.බ. | 47 | 91 |
| | දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව - උ.වි.ගෙ. | 2 | 4 |

| | | | |
|---|---|---|---|
| | දෛනික වැටුප් ගෙවීම | 25 | 51 |
| | ජල සැපයුම් උපකරණ | - | 1 |
| | වෙනත් විවිධ පුහුණු වියදම් | 80 | - |
| | වාහන කුලි | 2 | 11 |
| | උපකරණ නඩත්තු වියදම් | 12 | 8 |
| | වෙනත් ගෙවිය යුතු වියදම් | 5 | - |
| | විජය පුවත්පත් සමාගම | - | 61 |
| | විගණන දෙපාර්තමේන්තුව - විගණන ගාස්තු | 336 | 341 |
| | **මුළු ගෙවිය යුතු වියදම** | **2,833** | **3,557** |

| | | | |
|---|---|---|---|
| 10 (සි) | **ඉදිරියට ගෙන ගිය පාඨමාලා ගාස්තු** | 2014 | 2013 |
| | **මුළු ඉදිරියට ගෙන ගිය පාඨමාලා ගාස්තු** | **1,112** | **1,885** |

| | | | |
|---|---|---|---|
| 10 (ඩී) | **ආපසු ගෙවිය යුතු තැම්පතු** | | |
| | ආපසු ගෙවිය යුතු පාඨමාලා ණය | 8 | 7 |
| | ආපසු ගෙවිය යුතු ආරක්ෂක තැම්පතු - සේවක | 102 | 86 |
| | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැම්පතු | 182 | 45 |
| | ආපසු ගෙවිය යුතු වෛද්‍ය තැම්පතු | 1,017 | 867 |
| | **එකතුව** | **1,309** | **1,005** |

| | | | |
|---|---|---|---|
| | **මුළු කෙටි කාලින ගෙවිය යුතු දෑ** | **14,612** | **12,509** |

| | | | |
|---|---|---|---|
| 11 | **කෙටි කාලින වෙන්කිරීම්** | | |

| | | | |
|---|---|---|---|
| 11 (ඒ) | **විලම්භිත ආදායම කෙටි කාලින** | | |
| | තේ සංවර්ධන ව්‍යාපෘති ප්‍රකාශන | 28 | 28 |
| | **එකතුව** | **28** | **28** |

| | | | |
|---|---|---|---|
| 11 (බී) | **අසම්භාව්‍ය වගකීම්** | | |
| | 1/01 දිනට ශේෂය | 2,449 | 1,874 |
| | ආදායම් ප්‍රකාශනයට අය කල මුදල | 608 | 575 |
| | 31/12 දිනට ශේෂය | **3,057** | **2,449** |

| | | | |
|---|---|---|---|
| | **මුළු කෙටි කාලින වෙන්කිරීම්** | **3,085** | **2,477** |

| | |
|---|---|
| 12 | **සේවක ප්‍රතිලාභ** |

| | | | |
|---|---|---|---|
| | ගෙවිය යුතු පාරිතෝෂිත - වර්ෂයක් ඇතුලත | **1,663** | **254** |

| | |
|---|---|
| 13 | **දිගු කාලින වෙන් කිරීම්** |

| | | | |
|---|---|---|---|
| | **ප්‍රාග්ධන සඳහා වූ විලම්භිත රාජ්‍ය ප්‍රදාන** | | |
| | 01/01 දිනට ශේෂය | 66,770 | 60,421 |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 21,500 | 23,100 |
| | අඩු - ආදායම් ප්‍රකාශයට මාරු කිරීම (සටහන 01) | (20,837) | (16,751) |
| | **31/12 දිනට ශේෂය** | **67,433** | **66,770** |

| | | | |
|---|---|---|---|
| **සටහන් 01** | ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 10,937 | 9,253 |
| | ශක්‍යතා වර්ධන වැඩසටහන් | 9,900 | 7,498 |
| | | **20,837** | **16,751** |
| | | | |
| **14** | **සේවක ප්‍රතිලාභ** | | |
| | | | |
| | පාරිතෝෂිත ගෙවීම සඳහා - වර්ෂයකට වැඩි | **5,547** | **6,183** |

| | | | |
|---|---|---|---|
| **15** | **ප්‍රාග්ධන වෙන් කිරීම් හා වෙනත් රාජ්‍ය අස්ථිත්වය** | | |
| | ශ්‍රී ලංකා තේ මණ්ඩලය දායක වු ප්‍රාග්ධනය | 1,900 | 1,900 |
| | බගවන්තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානය (SLSPC) | 4,206 | 4,206 |
| | රාජ්‍ය ඒකාබද්ධ අරමුදල් වලින් ලද ප්‍රාග්ධන ප්‍රදාන | 32,281 | 32,281 |
| | **එකතුව** | **38,387** | **38,387** |

| | | | |
|---|---|---|---|
| **16** | **සංචිතයන්** | | |
| | | | |
| | **ප්‍රත්‍යාගණන සංචිත** | **107,260** | **10,584** |

| | | | |
|---|---|---|---|
| **17** | **සමුච්චිත අතිරික්තය /(හිගය)** | | |
| | රදවා ගත් ලාභය | (23,321) | (24,351) |
| | | **(23,321)** | **(24,351)** |

| | | | |
|---|---|---|---|
| **18** | **රාජ්‍ය පුනරාවර්තන ප්‍රදාන** | **24,792** | **18,744** |

| | | | |
|---|---|---|---|
| **19** | **විලම්බිත රාජ්‍ය ප්‍රදානයන්ගෙන් ආදායමට ගත් මුදල්** | | |
| | 2010 වසරට පෙර ප්‍රාග්ධන වියදම් මඟින් | 5,214 | 5,214 |
| | 2010 වසරේ ප්‍රාග්ධන වියදම් මඟින් | 567 | 567 |
| | 2011 වසරේ ප්‍රාග්ධන වියදම් මඟින් | 2,902 | 2,902 |
| | 2012 වසරේ ප්‍රාග්ධන වියදම් මඟින් | 369 | 369 |
| | 2013 වසරේ ප්‍රාග්ධන වියදම් මඟින් | 1,586 | 201 |
| | 2014 වසරේ ප්‍රාග්ධන වියදම් මඟින් | 299 | - |
| | ශක්‍යතා වර්ධන වැඩසටහන් | 9,900 | 7,498 |
| | | **20,837** | **16,751** |

| | |
|---|---|
| **20** | **පුහුණු ආදායම්** |

| | | | |
|---|---|---|---|
| 20 (ඒ) | **අධ්‍යාපනික හා වෘත්තිය පුහුණු වැඩ සටහන්** | | |
| | ජාතික වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | 868 | 1,363 |
| | වැවිලි ව්‍යාප්ති කළමනාකරණ සහතික පත් පාඨමාලාව | 768 | 1,014 |
| | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 280 | 194 |
| | ගිණුම් හා මුල්‍ය කළමනාකරණ සහතික පත් පාඨමාලාව | 591 | 755 |
| | වැවිලි ගිණුම් හා පොත් තැබීමේ සහතික පත්‍ර පාඨමාලාව | 535 | 722 |
| | තේ නිෂ්පාදනය සහ කර්මාන්ත ශාලා පරිශ්‍රය පිළිබඳ වෘත්තිය පාඨමාලා | 837 | 700 |
| | තේ නිෂ්පාදන පිළිබඳ ජාතික සහතික පත් පාඨමාලාව | - | 162 |
| | භාෂා ප්‍රවීණතා විභාගය | - | 245 |
| | ව්‍යාපාර ඉංග්‍රීසි සහතික පත් පාඨමාලාව (විධායක සහ විධායක නොවන) | 69 | 283 |
| | වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධි පාඨමාලාව - ආදායම | - | 89 |
| | රබර් නිෂ්පාදනය පිළිබඳ වෘත්තිය පාඨමාලා | 248 | - |
| | | **4,196** | **5,527** |
| 20 (බී) | **ව්‍යාපාර සංවර්ධන සහ කළමනාකරණ වැඩ සටහන්** | | |
| | කළමනාකරණ සංවර්ධනය පිළිබඳ වැඩ සටහන් | 1,332 | 242 |
| | | **1,332** | **242** |
| 20 (සී) | **කුසලතා සංවර්ධන වැඩ සටහන්** | | |
| | කුසලතා සංවර්ධන වැඩ සටහන් තේ කර්මාන්ත ශාලා නිලධාරී | 350 | 750 |
| | කුසලතා සංවර්ධන වැඩ සටහන් තේ ක්ෂේත්‍ර නිලධාරී | 368 | 345 |
| | කුසලතා සංවර්ධන වැඩ සටහන් රබර් ක්ෂේත්‍ර නිලධාරී | - | 360 |
| | කුසලතා සංවර්ධන වැඩ සටහන් රබර් කර්මාන්ත ශාලා නිලධාරී | - | 255 |
| | ඔයිල් ෆාම් වගාව සහ කළමනාකරණය සඳහා කුසලතා සංවර්ධන වැඩ සටහන් | - | 25 |
| | | **718** | **1,735** |
| 20 (ඩී) | **වතු පාලක පෙරහුරු පාඨමාලාව** | **2,465** | **2,720** |
| 20 (ඉ) | **සේවක සංවර්ධන සහ ව්‍යාප්ති වැඩ සටහන්** | | |
| | කුරුඳු වගාව පිළිබඳ වැඩ සටහන් | 50 | - |
| | | **50** | **-** |
| 20 (එෆ්) | **විශේෂ වැඩ සටහන්** | | |
| | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා විශේෂ වැඩ සටහන් | 866 | 734 |
| | | **866** | **734** |
| 20 (ජී) | **බාහිර විභාග පැවැත්වීම තුළින් ලද ආදායම** | **410** | **615** |

| | මුළු පුහුණු ආදායම | 10,037 | 11,573 |
|---|---|---|---|

| 21 | පහසුකම් කුලියට දීමෙන් ලද ආදායම | | |
|---|---|---|---|
| | බාහිර පුහුණු වැඩ සටහන් සඳහා නවාතැන් පහසුකම් ලබා දීමෙන් ලද අදායම | 691 | 1,731 |
| | අභ්‍යන්තර පුහුණු වැඩ සටහන් වල සිසුන්ට නවාතැන් පහසුකම් ලබා දීමෙන් ලද අදායම | 48 | 60 |
| | කොරියානු පුහුණු වැඩ සටහන් මගින් ලද ආදායම - අතුරුගිරිය | 5,480 | 4,779 |
| | | **6,219** | **6,570** |

| 22 | බගවන්තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානය | | |
|---|---|---|---|
| | බාහිර පුහුණු වැඩ සටහන් සඳහා පහසුකම් ලබා දීමෙන් ලද අදායම | 2,558 | 1,467 |
| | කොරියානු පුහුණු වැඩ සටහන් - බගවන්තලාව | 5,266 | 6,780 |
| | | **7,824** | **8,247** |

| 23 | පොලී ආදායම් | | |
|---|---|---|---|
| | කාර්ය මණ්ඩල ණය පොලී - ආපදා ණය | 87 | 98 |
| | සාමාජිකත්ව ගිණුමෙන් ලද පොලී ආදායම | 6 | 5 |
| | තැම්පතු වලින් ලද පොලී ආදායම | 944 | 422 |
| | විශේෂ ණය වලින් ලද පොලී ආදායම | 1 | 1 |
| | | **1,038** | **526** |

| 24 | වෙනත් ආදායම් | | |
|---|---|---|---|

| 24 (බි) | වෙනත් ආදායම් | | |
|---|---|---|---|
| | ආදායම් - අයදුම්පත් සහ විභාග ප්‍රශ්න පත්‍ර | 7 | 9 |
| | නිවාස කුලී ආදායම | 90 | 92 |
| | ප්‍රවාහන ආදායම | 6 | 30 |
| | මුද්‍රණ කටයුතු වලින් ලද ආදායම | - | 27 |
| | ආපසු නොගෙවන තැම්පතු /පාඨමාලා ණය | - | 11 |
| | ප්‍රකාශන | 23 | 84 |
| | දුරකථන ගාස්තු | 2 | 3 |
| | සාමාජික දායක මුදල් | 15 | 5 |
| | වෙනත් ආදායම් | 16 | 7 |
| | දායක මුදල් වලින් ලද ආදායම් | 40 | 43 |
| | | **199** | **311** |

| 25 | වැටුප් හා සේවක ප්‍රතිලාභ |
|---|---|

| 25 (ඒ) | පුද්ගල පඩිනඩි | 2014 | 2013 |
|---|---|---|---|
| | වැටුප්, වේතන | 7,853 | 7,566 |
| | ජීවන වියදම් හා වෙනත් දීමනා | 5,142 | 3,905 |
| | අතිකාල දීමනා | 896 | 742 |

| | | | |
|---|---|---|---|
| | නිවාඩු දින සඳහා ගෙවීම් | 133 | 80 |
| | ආයතනික කාර්ය මණ්ඩලය සඳහා දේශන ගාස්තු | 139 | 160 |
| | දෛනික වැටුප් | 63 | 344 |
| | සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් | 342 | 316 |
| | සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායක මුදල් | 1,356 | 1,261 |
| | සභාපති පාරිශ්‍රමිකය | 600 | 600 |
| | වෛද්‍ය ආධාර සඳහා දායක මුදල් | 820 | 842 |
| | | **17,344** | **15,816** |

| | | | |
|---|---|---|---|
| **25 (බී)** | **ගමන් වියදම්** | | |
| | ගමන් සහ යැපුම් දීමනා (දේශීය) | 214 | 165 |
| | | **214** | **165** |

| | | | |
|---|---|---|---|
| **25 (සී)** | **විශ්‍රාමික ප්‍රතිලාභ** | | |
| | සේවක පාරිතෝෂික දීමනා සඳහා පිරිවැය | 1,480 | 967 |
| | | **1,480** | **967** |

| | | | |
|---|---|---|---|
| **25 (ඩී)** | **සුභ සාධක දායකත්ව සහ සහනාධාර** | | |
| | සේවාස්ථ පුහුණු | 110 | 97 |
| | සේවක සුභ සාධක (තේ සැපයීම සහ වෛද්‍ය ප්‍රතිකාර) | 302 | 259 |
| | දායකත්ව මුදල් | 2 | |
| | | **414** | **356** |

| | | |
|---|---|---|
| **මුළු වැටුප් හා වේතන සහ සේවක ප්‍රතිලාභ** | **19,452** | **17,304** |

| | | | |
|---|---|---|---|
| **26** | **සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය භාවිතයන්** | | |
| | මුද්‍රණ උපකරණ සහ කඩදාසි | 376 | 630 |
| | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 33 | 271 |
| | පාරිභෝගික භාණ්ඩ | 111 | 35 |
| | ඉන්ධන | 1,708 | 2,054 |
| | වාර සගරාව සහ පුවත්පත් | 14 | 14 |
| | නිළ ඇඳුම් | 56 | 83 |
| | ආයතන ප්‍රකාශය | 315 | 423 |
| | **මුළු සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය භාවිතයන්** | **2,910** | **3,510** |

| | | | |
|---|---|---|---|
| **27** | **ස්ථාවර වත්කම් අළුත්වැඩියාව සහ නඩත්තු පිරිවැය** | | |
| | යන්ත්‍ර සහ පිරියත | 44 | 174 |
| | ගොඩනැගිලි | 585 | 487 |
| | උපකරණ | 598 | 400 |
| | ජලය, දුරකථන සහ විදුලිය | 180 | 16 |
| | මෝටර් වාහන | 2,263 | 1,639 |
| | **මුළු අළුත්වැඩියාව සහ නඩත්තු** | **3,670** | **2,716** |

| | | | |
|---|---|---|---|
| 28 (ඒ) | **සන්නිවේදනය, උපයෝගිතා සහ සහ වෙනත් ගිවිසුම් හා සේවා** | | |
| | දුරකථන සහ අන්තර්ජාල | 612 | 506 |
| | තැපැල් ගාස්තු | 163 | 164 |
| | විදුලිය | 1,924 | 1,655 |
| | ජල සැපයුම | 51 | - |
| | රක්ෂණ (ගොඩනැගිලි, වාහන, මුදල් වැනි දෑ) | 398 | 590 |
| | ආරක්ෂක සේවා | 1,797 | 1,437 |
| | විගණන ගාස්තු (බාහිර) | 150 | 200 |
| | කුලී වාහන වියදම් | 73 | 243 |
| | පිරිසිදු කිරීමේ වියදම් | 236 | - |
| | නීතිඥ වියදම් | - | 6 |
| | බැංකු වියදම් | 36 | 34 |
| | මුද්දර බදු, බදු සහ ගාස්තු | 79 | 73 |
| | | **5,519** | **4,908** |

| | | | |
|---|---|---|---|
| 28 (බී) | **මාධ්‍ය, ප්‍රචාරණය සහ ප්‍රසිද්ධිය** | | |
| | දැන්වීම් වියදම | 1,570 | 1,031 |
| | සංග්‍රහ වියදම් | 28 | 55 |
| | | **1,598** | **1,086** |
| | | | |
| | **මුළු සංනිවේදන උපයෝගිතා සහ වෙනත් ගිවිසුම් ගත සේවා සහ මධ්‍ය වියදම්** | **7,117** | **5,994** |

| | | | |
|---|---|---|---|
| 29 | **පුහුණු වියදම** | | |
| | සම්පත් දායකයන් සඳහා දේශන ගාස්ත හා ගමන් වියදම් | 2,097 | 1,801 |
| | කුඩා වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන් | 9,936 | 7,498 |
| | පුහුණුවට අදාල කම්ටු සඳහා ගෙවීම් | 68 | 90 |
| | පුහුණුව ලබන්නන් සඳහා ආහාර සහ නවාතැන් පහසුකම් සැපයීම | 1,498 | 1,312 |
| | රෙදි පිරිසිදු කිරීමේ වියදම් | 199 | 221 |
| | බොල් ණය ඌණ වෙන් කිරීම | 67 | - |
| | බාහිර විභාග සඳහා වියදම | 111 | 368 |
| | ත්‍යාග ප්‍රධානෝත්සවය සහ වාර්ෂික උත්සව | - | 265 |
| | අධ්‍යාපන උපකරණ | 86 | 121 |
| | විවිධ පුහුණු වියදම් | 313 | 79 |
| | **මුළු පුහුණු වියදම්** | **14,375** | **11,755** |

| | | | |
|---|---|---|---|
| 30 | **පහසුකම් කුලියට දීමෙන් සඳහා වියදම** | | |
| | ආහාර වියදම | 389 | 571 |
| | වැටුප් හා වේතන | 949 | 706 |
| | දීමනා | 429 | 723 |
| | සේවක අර්ථ සාධක අරමුදල් සඳහා දායකත්වය | 127 | 127 |
| | සේවක භාර කාර අරමුදල | 29 | 32 |
| | **මුළු පහසුකම් කුලියට දීම වෙනුවෙන් කුලී වියදම** | **1,923** | **2,159** |

| 31 | **බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ මෙහෙයුම් වියදම්** | | |
|---|---|---|---|
| | විදුලිය | 621 | 555 |
| | දුරකථන සහ තැපැල් ගාස්තු | 50 | 46 |
| | නඩත්තු | 28 | 43 |
| | ආහාර සැපයීම | 1,466 | 837 |
| | වැටුප් වේතන | 550 | 531 |
| | දීමනා | 132 | 207 |
| | සේවක ප්‍රතිලාභ | 73 | 31 |
| | දෛනික වැටුප් දීමනා | 738 | 561 |
| | සේවක භාර කාර අරමුදල | 15 | 18 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 59 | 73 |
| | පාරිභෝජන භාණ්ඩ | 10 | 22 |
| | වෙනත් විවිධ වියදම් | 21 | 12 |
| | **මුළු බගවන්තලාව මෙහෙයුම් වියදම්** | **3,763** | **2,937** |

| 32 | **වත්කම් ක්ෂය සහ ක්‍රමක්ෂය** | | |
|---|---|---|---|
| | ක්ෂය | 15,556 | 10,312 |
| | ක්‍රමක්ෂය | 277 | 183 |
| | | **15,833** | **10,495** |

| 33 | **විවිධ වියදම්** | | |
|---|---|---|---|
| | පාලක මණ්ඩලය සඳහා දීමනා | 273 | 388 |
| | වෙනත් කමිටු සඳහා දීමනා | 77 | 223 |
| | කමිටු සහ වෛද්‍ය යෝජනා ක්‍රම සඳහා | 6 | 6 |
| | අලාභ හානි | - | 161 |
| | උද්‍යාන නඩත්තුව | 262 | 320 |
| | වෙනත් | 255 | 273 |
| | | **873** | **1,372** |

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

**මූල්‍ය හා භෞතික ප්‍රගතියේ විශේෂ අවස්ථා (රු. 000)**

| විස්තරය | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | | |
| පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | 13,100 | 10,505 | 8,500 | 8,480 | 18,744 | 24,792 |
| විලම්භිත ප්‍රදානයන් ආදායම් වාර්තාවට ලියා හැරීම | | 3,368 | 3,934 | 9,415 | 9,253 | 10,937 |
| ධාරිතා සංවර්ධන වැඩ සටහන් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | | | | 4,865 | 7,498 | 9,900 |
| පුහුණු ආදායම් | 1,233 | 10,397 | 9,648 | 13,731 | 11,573 | 10,037 |
| බගවන්තලාව පුහුණු ආයතනයේ ආදායම් | 735 | 2,318 | 3,970 | 3,796 | 8,247 | 7,824 |
| වෙනත් ආදායම් | 5,097 | 10,565 | 10,746 | 8,935 | 7,407 | 7,456 |
| **මුළු ආදායම්** | **20,165** | **37,153** | **36,798** | **49,222** | **62,722** | **70,946** |
| **වියදම්** | | | | | | |
| මුළු පුද්ගල පඩිනඩි | 11,123 | 13,352 | 14,623 | 20,907 | 18,794 | 19,452 |
| පුහුණු වියදම | 748 | 4,132 | 4,348 | 6,425 | 4,256 | 4,439 |
| කුඩා වතු හිමියන් පුහුණු කිරීමේ වියදම (නොමිල පුහුණුව) | | | 1,790 | 4,865 | 7,498 | 9,936 |
| වෙනත් වියදම | 6,737 | 11,515 | 13,339 | 12,472 | 17,198 | 20,256 |
| **මුළු වියදම්** | **18,608** | **28,999** | **34,100** | **44,669** | **47,746** | 54,083 |
| **රාජ්‍ය පුනරාවර්තන ප්‍රදාන මුළු මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස** | 70% | 36% | 25% | 19% | 39% | **46%** |
| අතිරික්ත / (හිඟය) ක්ෂය අඩු කිරීමට පෙර | 1,557 | 8,154 | 2,698 | 4,553 | 14,976 | 16,863 |
| ක්ෂය / ක්‍රමක්ෂය | 2,875 | 3,374 | 3,946 | 9,150 | 10,495 | 15,833 |
| ශුද්ධ අතිරික්තය / (හිඟය) ක්ෂය අඩු කිරීමට පසු | (1,318) | 4,780 | (1,248) | (4,597) | 4,481 | 1,030 |
| පුහුණු වැඩ සටහන් (ආදායම් උපයන) | **5** | **45** | **30** | **61** | **22** | **32** |
| සහභාගි වූ සංඛ්‍යාව | **346** | **1,449** | **976** | **2,135** | **772** | **993** |
| කුඩා වතු හිමියන් පුහුණු කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | **-** | **-** | **74** | **188** | **236** | **355** |
| කුඩා වතු හිමියන් සඳහා ධාරිතා සංවර්ධන වැඩ සටහන් වෙනුවෙන් මුළු වියදම් | | | | 4,865 | **7,498** | **9,936** |
| පුහුණු කල කුඩා වතු හිමියන් සංඛ්‍යාව | **-** | **-** | **3,292** | **8,196** | **12,149** | **25,100** |
| **පුහුණු කල මුළු සංඛ්‍යාව** | **346** | **1,449** | **4,268** | **10,331** | **12,921** | **26093** |
| **වර්ෂය සඳහා මුළු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව** | **5** | **45** | **104** | **249** | **258** | **387** |
| සේවක සංඛ්‍යාව | **33** | **33** | **44** | **46** | **41** | **52** |
| සේවකයෙකු සඳහා උපයන ලද ආදායම (රු. 000) | 214 | 705 | 554 | 575 | 664 | 487 |
| පුහුණු සඳහා සහභාගි වූ අයෙකු සඳහා වියදම (රු. 000) | අ. නැ. | අ. නැ. | 0.54 | 0.59 | 0.62 | 0.40 |
| ආයතනයේ මුළු ශුද්ධ වත්කම් | 13.46 | 18.25 | 17.00 | 20.13 | 24.64 | 122.32 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. LP/K/NIPM/1/14/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2015 ජුලි දින

සභාපති

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1979 අංක 45 දරන ජාතික වැව්ලි කළමනාකරණ ආයතන පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**ප්‍රමිත අංක 07**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතිය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේදී එම වත්කම අයත් වන පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද , සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති වත්කම් වලින් රු.12,209,746 ක් පිරිවැය වූ ගොඩනැගිලි , කාර්යාල උපකරණ , ගෘහ භාණ්ඩ හා වෙනත් උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ii) කාර්යාල උපකරණ හා විවිධ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමෙන් වූ රු. 2,863,841 අලාභය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට නොගලපා වෙනත් වත්කම් ප්‍රත්‍යාගණනයෙන් වූ ලාභයට හිලව් කර තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පුහුණු අංශ ගොඩනැගිල්ල ඇතුළුව ආයතනයේ අනෙකුත් ගොඩනැගිලිවල සිදුකර තිබුණු අළුත්වැඩියාවන් වෙනුවෙන් යුධ හමුදාවේ 7 වෙනි ඉංජිනේරු රෙජිමේන්තුවට ශ්‍රම දායකත්වය වෙනුවෙන් ගෙවිය යුතු ලෙස රු.373,700 ක් 2013 වර්ෂයේ සිට ගිණුම්වල දක්වා තිබුණද එම වෙන් කිරීමේ නිවැරදිතාව තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.3. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුළු වටිනාකම රු.3,370,621 ක් වූ ණයගැතියන්ගෙන් රු. 82,500 ක් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක සිටද රු. 225,265 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිටද හිඟ හිටව පැවතුණි.

(ආ) ණයහිමියන්ට ගෙවීමට ඇති රු.9,358,168 ක් වූ වටිනාකමින් රු.4,291,000 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිටද රු.185,645 ක් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක්ද ඉක්මවා තිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 අංක 38 දරන පනතින් සංශෝධිත 1979 අංක 45 දරන ජාතික වැව්ලි කළමනාකරණ ආයතන පනතේ 6 වගන්තිය | (අ) අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අමාත්‍යාංශයෙන් නියෝජිතයන් දෙදෙනකු පත් කළ යුතු වුවත් පත් කර තිබුණේ එක් නියෝජිතයකු පමණි. |
| | (ආ) විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට වෘත්තීය සමිති නියෝජනය කරන සාමාජිකයන් දෙදෙනා පත්කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී.12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | කාලීන තැන්පතු රු.5,000,000 ක් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් හඳුනාගත හැකිවන පරිදි ඒවායේ පැවැත්ම හා ආරක්ෂාව තහවුරු වන පරිදි චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,030,263 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.4,482,528 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,452,265 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩිවීම සියයට 13 ක් වුවත් වියදමේ වැඩිවීම සියයට 20 ක් වීම මෙම පිරිහීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ආදායම රු.25,317,075 ක් වූ අතර එය සමස්ත මෙහෙයුම් වියදම රු.54,082,637 න් සියයට 47 ක් පමණක් ආවරණය කර ගැනීමට හැකිවී තිබුණි.

(ආ) ආයතනයේ සමස්ත ආදායමින් සියයට 36 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ආදායමින් ආවරණය වී තිබුණු අතර සියයට 35 ක් රජයේ ප්‍රදානයන් විය. ඉතිරි සියයට 29 ප්‍රාග්ධන ප්‍රදාන ආදායමට එරෙහිව කපාහැරීම් වලින් ආවරණය වී තිබුණි.

### 3.3 ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි

විනයානුකූල හේතු මත සේවයෙන් ඉවත් කරන ලද ආයතනයේ සේවකයකු විසින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා ආයතනයට එරෙහිව නඩුවක් ගොනු කර තිබුණි. මේ සඳහා ආයතනය විසින් රු.3,057,379 ක මුදලක් අසම්භාව්‍ය බැරකම් වශයෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කරන ලද පාඨමාලා හා වැඩසටහන් 237 කින් තථ්‍ය වශයෙන් පැවැත් වූ සංඛ්‍යාව 386 ක් වීමෙන් එය සියයට 163 ක ප්‍රතිශතයක් විය.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය සහ ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය ඒකාබද්ධව වැව්ලි කළමනාකරණ ක්ෂේත්‍රය හා සම්බන්ධ විධායක නිලධාරින් හා වැව්ලි කරුවන් සඳහා දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ 2005 වර්ෂයේදී ආරම්භ කරන ලද විද්‍යාවේදී (වැව්ලි කළමනාකරණ) බාහිර උපාධි පාඨමාලාව සම්බන්ධයෙන් ආයතනය හා විශ්ව විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) 2009 අගෝස්තු 17 දින සිට ආයතනයේ පුරප්පාඩුව පැවති පුහුණු නිලධාරි (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ) තනතුරට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත අයදුම්කරුවෙකු තෝරා ගෙන 2014 ජූලි 08 දින පත්වීම් ලිපියක් යවා තිබුණද අයදුම්කරු සේවයට වාර්තා නොකිරීම නිසා එම තනතුර 2015 ජූනි 15 දක්වාම පුරප්පාඩුව පැවතුණි.

(ඇ) සහකාර අධ්‍යක්ෂ පාලන තනතුර 2013 නොවැම්බර් 13 දින සිට පුරප්පාඩුව පැවති අතර 2014 ජූනි මාසයේ දී පුවත්පත් දැන්වීම් පලකර අයදුම්පත් කැඳවා තිබුණි. ලැබී තිබුණු අයදුම්පත් අතරින් අයදුම්පත් තුනක් තෝරාගෙන 2015 මැයි 31 දින දක්වා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණද තනතුර පිරවීමට කටයුතු කර නොතිබුණි. තවදුරටත් පුහුණු විශේෂඥ ( ගිණුම් හා මූල්‍ය කළමනාකරණ) මෙම තනතුරේ වැඩබැලීම සිදු කරමින් සිටින අතර ඒ වෙනුවෙන් ඔහුට මාසිකව රු.6,410 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවමින් පැවතුණි.

(ඈ) පරිපාලන නිළධාරී තනතුරට බඳවා ගැනීම සඳහා 2013 වර්ෂයේදී කුඩා තේවතු සංවර්ධන අධිකාරිය මඟින් තරඟ විභාගයක් පවත්වා තිබුණු අතර, එයට ආයතනය තුළින් පැමිණි විරෝධතා හේතුවෙන් එය නොසළකා නැවත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් තරඟ විභාගයක් පවත්වා තිබුණි. ශ්‍රී ලංකා සංවර්ධන

පරිපාලන ආයතනය විසින් පවත්වන ලද තරඟ විභාගයට පෙනී සිටි දෙදෙනාම අසමත් වීම නිසා නැවත පුවත් පත් දැන්වීමක් පලකර තිබුණු අතර ලැබී තිබුණු අයදුම්පත් අනුව 7 දෙනෙකු විභාගයට කැඳවන ලදී. මෙයින් සමත් වූ නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර එක් අයෙකු පත්කරගෙන තිබුණද ලකුණු ලබා දීමේ ක්‍රමවේදය නිශ්චිත නොවීය. තවද, මෙම තනතුර පිරවීම සඳහා බාහිර ආයතන මගින් පවත්වන ලද විභාග සඳහා රු.111,337 ක මුදලක් ආයතනය විසින් ගෙවා තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුහුණු අංශ ගොඩනැගිල්ලේ අළුත්වැඩියාව ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ ශ්‍රම දායකත්වයෙන් සිදුකර ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු රු. 1,034,707 ක ද්‍රව්‍ය ඇස්තමේන්තුවට අනුව අළුත්වැඩියා කටයුතු 2012 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, අවස්ථා දෙකකදීම සැලැසුම වෙනස් කර තිබුණි. සංශෝධිත ඇස්තමේන්තුව රු. 3,210,594 ක් වූ අතර එයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර, මෙම අළුත්වැඩියාව නිම කිරීම සඳහා 2013, 2014 වර්ෂවල දී ගොඩනැගිලි ද්‍රව්‍ය වෙනුවෙන් රු.3,596,122 ක් වැය කර තිබුණි. ඇස්තමේන්තුව ඉක්මවා තිබූ මුදල රු.385,528 ක් විය. මෙම සම්පූර්ණ අළුත්වැඩියාව කිරීමේදී කිසිදු අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) ආයතනයේ පුහුණු අංශයට කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2013 වර්ෂයේදී ආයතනයක් තෝරා ගෙන ඒ සඳහා රු. 276,000 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී ආයතනය අපේක්ෂා කළ අරමුණු ලබාගත හැකි වන පරිදි මෙම පද්ධතිය සංවර්ධනය කර නොතිබියදී රඳවා ගැනීමේ මුදල වූ රු. 24,000 ක මුදල 2014 ජුනි 24 දින එම ආයතනයට ගෙවා තිබුණු අතර, තොරතුරු පද්ධතියේ වාර්ෂික සේවා ගාස්තු වශයෙන් 2015 මාර්තු මාසයේදි තවත් රු.36,000 ක මුදලක්ද ගෙවා තිබුණි.

## 4.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ වැව්ලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා මොඩියුල සකස් කිරීම වෙනුවෙන් තෝරාගත් සම්පත් දායකයන් සඳහා විවෘත විශ්ව විද්‍යාලයේ පැවැත්වූ වැඩමුළුවට 2011 වර්ෂයේදී රු.450,000 ක් ද, 2012 වර්ෂයේ එම වැඩමුළුවට සහභාගී වීම වෙනුවෙන් සම්පත් දායකයන්ට ප්‍රවාහන දීමනා වෙනුවෙන් රු.232,500 ක් ද ගෙවා තිබුණි.

පාඨමාලාවට අයත් මොඩියුල 10 ක් අතුරින් ගණකාධිකරණය හා මූල්‍ය කළමනාකරණය සඳහා සකස් කරන ලද මොඩියුලයේ සංස්කරණ කටයුතු ලිඛිත පැවරීමකින් තොරව බාහිර පුද්ගලයෙකුට භාර දී තිබුණද මෙම මොඩියුලයේ සංස්කරණ කටයුතු 2015 මැයි මස දක්වාම නිම කර නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 56 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 45 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 01 ක් ද තෘතීයික මට්ටමේ තනතුරු 05 ක්ද ද්විතීයික මට්ටමේ තනතුරු 04 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක්ද පුරප්පාඩුව පැවතුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඇ) මෙහෙයුම් පාලනය

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)